සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව

# වාර්ෂික වාර්තාව

# 2024 - 2025

# පටුන

දැක්ම, මෙහෙවර, ආයතනික වටිනාකම් සහ ආයතනික අරමුණු .................... 04
මෙහෙයුම් අරමුණු, උපායමාර්ග සහ වසර තුළ ප්‍රගතිය .................... 05
සංස්ථාපිත තොරතුරු .................... 06
සභාපතිතුමාගේ පණිවිඩය .................... 07 - 08
ප්‍රධාන විධායක නිලධාරීගේ වාර්තාව .................... 09
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව .................... 10 - 11
ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය සහ අංශ ප්‍රධානීන් .................... 12 - 13
සංවිධාන ව්‍යුහය .................... 14
නිෂ්පාදන කළඹ .................... 15 - 17
ව්‍යාපාර සමාලෝචනය .................... 18
රැකියා උත්පාදනය .................... 19
ආයතනික පාලනය .................... 20
විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව .................... 21 - 22
විශේෂ මූල්‍ය සිදුවීම් .................... 23
විශේෂ මූල්‍ය සිදුවීම්වල ප්‍රස්ථාරික නිරූපණය .................... 24 - 25
සංස්ථාවේ වෙළඳ අංශයන්හි කාර්යසාධනය .................... 26 - 27
විගණකාධිපති වාර්තාව .................... 28 - 34
විශේෂ වැඩසටහන් 2024 / 2025 .................... 35 - 36
විස්තීරණ ආදායම් ප්‍රකාශනය .................... 37
මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව .................... 38
ස්කන්ධය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශනය .................... 39
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය .................... 40 - 41
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් .................... 42 - 63
වසර 10 සඳහා මූල්‍ය සංක්ෂේපනය .................... 64

# දැක්ම, මෙහෙවර, ආයතනික වටිනාකම් සහ ආයතනික අරමුණු

## අපගේ දැක්ම

දේශීය ව්‍යාපාර ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වීම

## අපගේ මෙහෙවර

ශ්‍රී ලංකාවට ආසියාවේ වාණිජ කේන්ද්‍රස්ථානය වීමට සහාය වීමේ අරමුණින් පාර්ශවකාර අභිලාෂ පවත්වා ගනිමින් අනෙකුත් සියලු අංශවල අවශ්‍යතා සපුරාලන අතර මූලිකවම රාජ්‍ය අංශයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම පිණිස ඊට අවශ්‍ය සියලු නිෂ්පාදන හා සේවා සැපයීම.

## ආයතනික වටිනාකම්

**S** - භාරකාරත්වය

**T** - විනිවිදභාවය සහ වගවීම

**C** - සහයෝගිතාව සහ හවුල්කාරිත්වය

සහ

**I** - සදාචාරතාවය සහ අවංකභාවය

## ආයතනික අරමුණ

සාධාරණ ඉපැයුම් ඉපැයීම, පුද්ගල හා වෘත්තීය සංවර්ධනයට දායක වීම සහ විශේෂිත සන්නාම හරහා නිෂ්පාදන නායකත්වය ස්ථාපිත කිරීම.

**අරමුණු අංක 01** : සන්නාම ස්ථාපිත කිරීම

**අරමුණු අංක 02** : නිෂ්පාදන හා සේවා කළඹ වර්ධනය කිරීම

**අරමුණු අංක 03** : සැපයුම් දාම මෙහෙයුම් වැඩිදියුණු කිරීම

**අරමුණු අංක 04** : මානව සම්පත සංවර්ධනය කිරීම

**අරමුණු අංක 05** : පද්ධති ක්‍රියාත්මක කිරීම

# මෙහෙයුම් අරමුණු, උපාය මාර්ග සහ වසර තුළ ප්‍රගතිය

## මෙහෙයුම් අරමුණු

- විවිධත්වයෙන් යුතු භාණ්ඩ හා සේවා විකුණුම තුළින් වෙළඳ පොළ ස්ථාවර කිරීම.
- කීර්තිමත් සහ විශ්වසනීය ජාත්‍යන්තර සන්නාම අප රට තුළ නියෝජනය කිරීම.
- ආයතනයේ ආදායම් සහ ලාභය වර්ධනය කිරීම මගින් එහි කීර්තිනාමය ස්ථාපිත කිරීම
- රාජ්‍ය අංශයේ අවශ්‍යතා ඵලදායීව සැපයීම මගින් සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම.
- ආයතනයේ ප්‍රධාන නිෂ්පාදන හරහා පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම පිණිස ක්‍රියාමාර්ග ආරම්භ කිරීම.
- රාජ්‍ය ප්‍රතිපත්ති, පාරිභෝගිකයන් සහ කාර්යමණ්ඩලය කෙරෙහි නිරන්තර අවධානය යොමුකිරීම මගින් නිෂ්පාදනය වැඩි දියුණු කිරීම.

## මෙහෙයුම් උපාය මාර්ග

- පාරිභෝගික පදනම සහ ප්‍රවේශ්‍යණතාව පුළුල් කිරීම.
- පාරිභෝගික අවශ්‍යතාවය අනුව නිෂ්පාදන කළඹ ඉහළ නැංවීම.
- ව්‍යවසාය සම්පත් කළමනාකරණ පද්ධතිය තුළින් වෙබ් සබල ව්‍යාපාරික කළමනාකරණය සහ දත්ත කළමනාකරණය සහ ප්‍රසම්පාදන අනුමතිය.
- ප්‍රධාන නිෂ්පාදන කාණ්ඩයන්හි සක්‍රීය සහ සඵල සහභාගීත්වය.

## වසර තුළ ප්‍රගතිය

මෙම වසරේ ආයතනයේ ව්‍යාපාරික ආදායම රු. මිලියන 8787 ක් ලෙස වාර්තා විය. සමාලෝචිත වර්ෂය තුළ අනෙකුත් මෙහෙයුම් ආදායම රු. මිලියන 49කි. බදු පූර්ව ශුද්ධ ලාභය රු. මිලියන 370 ක් ලෙස පෙන්නුම් කළ අතර මුළු ස්කන්ධ ප්‍රමාණය වසර තුළ රු. මිලියන 6186 දක්වා වැඩි වුණි.

2025 මාර්තු අවසන් වන විට සංස්ථාවේ සේවක සංඛ්‍යාව 285 ක් විය.

නිෂ්පාදන ආයතන සමග හවුල්කාරිත්වයෙන් අපගේම STC සන්නාමය සහිත නිෂ්පාදන ස්ථාපිත කිරීමට අප සැලසුම් කර ඇති අතර නිෂ්පාදන මාලාවක් සැලසුම් කරමින් පවතී.

# සංස්ථාපිත තොරතුරු

| | | |
|---|---|---|
| **සමාගමේ නම** | : | සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව |
| **නෛතික තත්ත්වය** | : | එස්.ටී.සී. ජෙනරල් ට්‍රේඩිං කම්පනි ලිමිටඩ් යන නාමය 2007 අංක 17 දරන සමාගම් පනත යටතේ 2010.10.01 වැනි දින ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව වශයෙන් වෙනස් කරන ලදී. පෙර ලංකා ජෙනරල් ට්‍රේඩිං කම්පනි ලිමිටඩ් යන්න 1982 අංක 17 දරන රාජ්‍ය සමාගම් පනත යටතේ පනවා තිබූ අතර එයට පෙර 1970 අංක 33 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ පනත මෙම ආයතනය ප්‍රසිද්ධ වූයේ ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව යනුවෙනි.<br><br>මෙම සමාගම වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්ත ය. |
| **සභාපති/ කළමනාකරණ අධ්‍යක්ෂක:** | | ජේ. රවින්ද්‍ර ප්‍රනාන්දු මහතා (2024.11.08 දින සංස්ථාවට බැඳුණි.)<br>ආසිරි වලිසුන්දර මහතා (2024.09.25 දින ඉල්ලා අස්විය.) |
| **අධ්‍යක්ෂක මණ්ඩලය** | : | ආර්. එම්. ඩබ්ලිව්. බණ්ඩා මහතා (2024.11.29 දින සම්බන්ධ විය)<br>කේ. සත්‍යකුමාර් මහතා (2024.11.29 දින ඉල්ලා අස්විය)<br>ජේ. ඒ. අයි. ඒ. පෙරේරා මහත්මිය (2024.12.09 දින සම්බන්ධ විය)<br>ජී. දහනායක මහත්මිය (2024.10.31 දින ඉල්ලා අස්විය)<br>එල්. ටී. එස්. ප්‍රියන්ත මහතා (2024.12.09 දින සම්බන්ධ විය)<br>ටී. ඒ. ඩී. රංජිත් මහතා (2024.10.04 දින ඉල්ලා අස්විය)<br>අයි. ඒ. ගුණවර්ධන මහතා (2024.12.09 දින සම්බන්ධ විය)<br>සී. පීරිස් මහතා (2024.10.04 දින ඉල්ලා අස්විය)<br>ටී. එස්. මල්ලවාරච්චි මහතා (2024.12.09 දින සම්බන්ධ විය)<br>කේ. ආර්. එස්. පෙරේරා මහතා (2024.10.04 දින ඉල්ලා අස්විය)<br>ජේ. එන්. නානායක්කාර මහතා (2024.12.09 දින සම්බන්ධ විය)<br>ඩී. ඒ. හෙට්ටිආරච්චි මහතා (2024.12.20 දින ඉල්ලා අස්විය) |
| **සමාගම් ලේකම්** | : | ඒ. ඩබ්ලිව්. මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගම |
| **විගණක** | : | විගණකාධිපති<br>ජාතික විගණන කාර්යාලය,<br>අංක 306/72,<br>පොල්දූව පාර, බත්තරමුල්ල. |
| **බැංකුකරුවන්** | : | මහජන බැංකුව<br>ජාතික සංවර්ධන බැංකුව<br>සම්පත් බැංකුව<br>ලංකා බැංකුව |
| **ලියාපදිංචි කාර්යාලය** | : | 100, නවම් මාවත, කොළඹ - 02, ශ්‍රී ලංකාව. |
| **දුරකථනය** | : | +94 112 422341-4, +94 112 440880 |
| **ෆැක්ස්** | : | +94 112 447970 |
| **විද්‍යුත් තැපෑල** | : | lankagen@sltnet.lk |
| **වෙබ් අඩවිය** | : | www.stc.lk |
| **සමාගම් ලියාපදිංචි අංකය** | : | PB 863 |
| **සේවක සංඛ්‍යාව** | : | අවසන් වූ වර්ෂය තුළ සමාගම විසින් සේවකයන් 285 දෙනෙකු සේවයේ යොදවන ලදී. |

# සභාපතිතුමාගේ පණිවිඩය

සීමාසහිත ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ 2024/2025 මූල්‍ය වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ගෞරවයකි.

**බාහිර පාරිසරික බිහිදසුන**

අභියෝග මෙන්ම ඉඩප්‍රස්ථා අප ඉදිරියේ තබමින් ගෝලීය හා දේශීය ආර්ථික ක්ෂේත්‍ර අඛණ්ඩව විකසනය වෙයි. ශ්‍රී ලංකාව වර්ධනය වන ප්‍රත්‍යාස්ථතාලක්ෂණ පෙන්වමින් ආර්ථික සීරුමාරුවක කාලපරිච්ඡේදයක් පසු කර පැමිණ ඇත. රජයේ විචක්ෂණශීලී මූල්‍ය කළමනාකරණය සහ උපායමාර්ගික ප්‍රතිපත්ති මූලකෘත්‍යයන් මගින් සාර්ව - ආර්ථික ස්ථාවරත්වය පිළිබඳ ශක්තිමත් පදනමක් දමමින්, ව්‍යාපාර කටයුතුවලට හිතකාමී පරිසරයක් ඇති කර තිබේ.

2024 වර්ෂය ආරම්භයේදී ශ්‍රී ලංකාව විසින් 5.3% ක දළ දේශීය නිෂ්පාදිතයක් (GDP) වාර්තා කරන ලදී. රටේ මෙම යහපත් ආර්ථික පරිසරය අපගේ නිෂ්පාදන කළඹ විවිධාංගීකරණය කිරීම, අපගේ ගනුදෙනුකාර පදනම ව්‍යාප්ත කිරීම හා අපගේ මෙහෙයුම් උපායමාර්ග ශක්තිමත් කිරීම පිණිස අපගේ නිත්‍ය ව්‍යාපාරික මෙහෙයුම්වල ඉහළ දෙසට වූ සමස්ත ජවය කෙරෙහි කැපී පෙනෙන ලෙස දායක වී ඇත.

මුඛ්‍ය වෙළඳ සංවිධානයක් ලෙස රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව ලාභදායිත්වය වඩා යහපත් කර ගැනීම හා ජාතික භාණ්ඩාගාරය වෙත දායක වීම මගින් ශ්‍රී ලාංකික ආර්ථිකයේ වර්ධනයට උර දීමෙහිලා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.අපි මෙය ඉටු කරනුයේ රාජ්‍ය හා පෞද්ගලික අංශ වෙළඳපල වෙත උසස් තත්ත්වයේ භාණ්ඩ තරගකාරී මිල ගණන්වලට සැපයීම මගිනි. ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති දිශානතිය ඔස්සේ යමින්, රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" වශයෙන් වූ ජාතික දැක්ම කෙරෙහි පූර්ණ ලෙසම ඇපකැප වී සිටී.උපායමාර්ගික මූලකෘත්‍යයන් සහ වගකීමෙන් යුතු ව්‍යාපාරික පිළිවෙත් හරහා අපි මෙම දිගු-කාලීන අපේක්ෂාව සාක්ෂාත් කර ගැනීමෙහිලා සක්‍රිය හා අඛණ්ඩ කාර්යභාරයක් ඉටු කිරීමට අපි අරමුණු කරමු.

**කාර්යසාධන සමාලෝචනය**

රජය ආර්ථික ප්‍රතිසාධනය උත්තේජනය කිරීමට කටයුතු කරමින් සිටින වකවානුවක, රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව 2024/2025 මූල්‍ය වර්ෂය සඳහා රුපියල් මිලියන 370 ක බද්දට පෙර ලාභයක් අත් කර ගත් බව වාර්තා කරන්නේ සතුටිනි. බද්දෙන් පසු ශුද්ධ ලාභය රුපියල් මිලියන 259 ක් විය.

සමාගමේ වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 8,787 ක් වූ අතර, දළ ලාභ ආන්තිකය 10% ක් විය.ප්‍රධාන වශයෙන්, අපගේ විශේෂ ව්‍යාපෘති ඒකකය යටතේ වූ අත්‍යවශ්‍ය ආහාර අංශය ඇතුළත ක්‍රියාකාරකම්වල පහළ වැටීමක් හේතුවෙන් මුළු පිරිවැටුම පෙර වර්ෂයට සාපේක්ෂව 28% ක පිරිහීමක් වාර්තා කළද, අපගේ නිත්‍ය ව්‍යාපාර කටයුතු තුළ පෙර වර්ෂයට සාපේක්ෂව 52% කින් ඉහළ යමින් ශක්තිමත් කාර්යසාධනයක් පෙන්වී ය.

මෙම ප්‍රසාද ජනක වර්ධනය විශේෂයෙන්ම රසායන හා ඒ ආශ්‍රිත නිපැයුම්, ගෙදර දොර නිපැයුම්, ඉදිකිරීම් හා දෘඪාංග ද්‍රව්‍ය, කෘෂිකාර්මික සැපයුම් හා යන්ත්‍රෝපකරණ, තොරතුරු සන්නිවේදන තාක්ෂණ නිපැයුම් සහ විදුලි හා විද්‍යුත් නිපැයුම් ඇතුළු ව්‍යාපාරික අංශ කිහිපයක් සිසාරා දක්නට ලැබුණි.මෙම ප්‍රගතිය රේඛීය අමාත්‍යාංශය, අධ්‍යක්ෂ මණ්ඩලය සහ රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථා කළමනාකරණ මණ්ඩලය විසින් ගනු ලැබූ නිවැරදි හා කාලෝචිත තීරණයන්හි ප්‍රතිඵලයයි. ඔවුන්ගේ ඇපකැප වීම සහ දූරදර්ශීත්වය අභියෝගාත්මක මෙන්ම විපුල ඵල සහිත මූල්‍ය වර්ෂයක් ඔස්සේ තරණය කිරීමෙහිලා ඉවහල් විය.

**සාමාජීය වගකීම**

රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව රජයට අවශ්‍ය වූ සෑම අවස්ථාවකම අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනකරුවකු හා බෙදාහරින්නකු වශයෙන් වූ සිය කාර්යභාරය නිරතුරුවම ඉෂ්ට කරමින්, වෙළඳපල ස්ථාවරත්වය හා ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමට උපකාරී වී ඇත. මෙම උපායමාර්ගික මැදිහත් වීම විශේෂයෙන්ම වැදගත් වන්නේ මිල වාෂ්පශීලීත්වය පාරිභෝගිකයින්ට වඩාත් බලපාන අවස්ථා වන සැපයුම් අඩාල වූ හෝ ඉල්ලුම ඉහළ ගිය අවස්ථාවන්හිදී ය.නියත සැපයුමක් පවත්වා ගෙන යාම හා මිල පාලනය කිරීම මගින්, රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව කෘත්‍රිම හිඟයන් වලක්වා, හදිසි හා අසාධාරණ මිල ඉහළ දැමීම් කෙරෙන් පාරිභෝගිකයින් ආරක්ෂා කර ගැනීමේ රජයේ අරමුණට උර දෙයි.

2025 මාර්තු 31 දිනට රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව 285 දෙනකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් සේවයේ යොදවා තිබුණි.

**අනාගත සැලසුම් - 2025/2026**

රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව එළඹෙන මූල්‍ය වර්ෂය තුළ තිරසාර වර්ධනය හා විවිධාංගීකරණය මත නාභිගතව සිටී. මුඛ්‍ය උපායමාර්ගික මූලකෘත්‍යයන්ට පහත ඒවා ඇතුළත් වේ.

- **විදුලි උපකරණ සඳහා දීප - ව්‍යාප්ත අලෙවි ජාලයක් ස්ථාපිත කිරීම**
  නාගරික මෙන්ම ග්‍රාමීය ප්‍රදේශ ආවරණය කරමින් ශක්තිමත් අලෙවි ජාලයක් ගොඩනැගීමට රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව අපේක්ෂා කරයි. මෙය අපගේ වෙළඳපල අවතීර්ණය ව්‍යාප්ත කිරීමටත්, විකිණුම් පරිමාව වැඩි කර ගැනීමටත්, ගනුදෙනුකාර සේවා සම්පාදනය වැඩිදියුණු කිරීමටත් උපකාරී වනු ඇති අතර එමගින් වඩා පුළුල් පාරිභෝගික හා වාණිජ වෙළඳපලවලට අවතීර්ණ වීම මගින් රාජ්‍ය අංශයේ විකිණීම් මත ඇති අපගේ යැපීම පහත යනු ඇත.

- **අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය හා බෙදා හැරීම**
  මිල ගණන් ස්ථාවරව පවත්වා ගෙන යාම සහ ප්‍රමාණවත් සැපයුමක් පවත්වා ගැනීම පිණිස, රජයට අවශ්‍ය අවස්ථාවන්හිදී අවශ්‍ය පරිද්දෙන් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීමේ හා බෙදා හැරීමේ කටයුතු කඩිනමින් ඉටු කිරීමේ කාර්යය රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව අඛණ්ඩව සිදු කරනු ඇත.

- **සිල්ලර අලෙවි ප්‍රදර්ශනාගාරවල කාර්යසාධනය දියුණු කිරීම**
  රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගරවල ප්‍රදර්ශනාගාර ජාලයක් මෙහෙයවයි.මේ වන විට ප්‍රදර්ශනාගාර ආදායමෙන් 80% ක් ණයට විකිණීමෙන් උත්පාදනය කෙරෙන අතර, 20% ක් සෘජුව පැමිණ මිලට ගන්නා ගනුදෙනුකරුවන් වෙතින් උපයනු ලැබේ. මුදල් ප්‍රවාහය වැඩි කොට ණය නිරාවරණය අඩු කරනු පිණිස රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව සිය ප්‍රදර්ශනාගාරය වෙත පැමිණ මිලට ගන්නා ගනුදෙනුකාර පදනම 50% කින් වැඩි කිරීමට සැලසුම් කරයි.

- **පවත්නා ව්‍යාපාර වර්ධනය කිරීම හා නිෂ්පාදන කළඹ පුළුල් කිරීම**
  තිරසාර වර්ධනය සඳහා වූ රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ උපායමාර්ගික දිශානතියේ කොටසක් ලෙස, සංස්ථාව සිය පවත්නා ව්‍යාපාරික අංග වඩා වර්ධනය කරන අතරම, විකසනය වෙමින් ඇති වෙළඳපල ඉල්ලුම් සපුරාලනු පිණිස සිය නිෂ්පාදන කළඹ ව්‍යාප්ත කිරීම මත ශක්තිමත් අවධාරණයක් යොදවා ඇත. මෙම ප්‍රවේශය රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙහි තරගකාරී වාසිය ශක්තිමත් කිරීමටත්, ලාභදායිත්වය වැඩි කිරීමටත්, එහි වෙළඳපල අවතීර්ණය පුළුල් කිරීමටත් ඉතා වැදගත් වෙයි.

**ඇගයීම**

මෙම ආයතනයේ අභිවෘද්ධිය උදෙසා කටයුතු කිරීම අඛණ්ඩව කර ගෙන යාමේදී මම මාගේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායමේ හා සමස්ත කාර්ය මණ්ඩලයේ නොසැලෙන සහයෝගය මත විශ්වාසය තබමි.වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන ගරු අමාත්‍යතුමාගේ දූරදර්ශී නායකත්වය සහ මාගේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ අඛණ්ඩ මාර්ගෝපදේශකත්වය හා ඇපකැපවීම සම්බන්ධයෙන් මාගේ හද පිරි ප්‍රශංසාව පුද කරනු කැමැත්තෙමි.එමෙන්ම මෙම මූල්‍ය වර්ෂය මුළුල්ලේ අප සමග සිටි අපගේ බැංකුකරුවන් සහ අනෙකුත් සියලු පාර්ශ්වකරුවන් වෙත හෘදයංගම ස්තූතිය පළකිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.ඔබගේ විශ්වාසය හා සහයෝගය අපගේ ප්‍රගතියේ අගනා සාධකයක් වූ අතර ඉදිරි වර්ෂයන්හිදී ද ඔබගේ අඛණ්ඩ හවුල්කාරිත්වය අපේක්ෂා කරමි.



**ජේ. රවීන්ද්‍ර ප්‍රනාන්දු**

සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ

# ප්‍රධාන විධායක නිලධාරීගේ වාර්තාව

**(2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා)**

රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවට 2024/2025 වර්ෂය සංකේන්ද්‍රිත මෙහෙයුම් කළමනාකරණයේ කාලපරිච්ඡේදයක් වූයේ මෙම වර්ෂය තුළ මෙම සංස්ථාව ක්‍රමානුකූල ජාතික ආර්ථික ප්‍රකෘතිකරණ පරිසරයක් තුළ ක්‍රියාත්මක වූ බැවින් ය. මූලික වෙළඳ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම, කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ අවශ්‍ය විට රජයේ මැදිහත්වීම් සඳහා උපකාරී වීමේ සූදානම්භාවය සහතික කිරීම කෙරෙහි කළමනාකරණ ප්‍රයත්නයන් දිශාගත විය.

සංස්ථාව මෙම වර්ෂය තුළ රුපියල් මිලියන 8,787 ක පිරිවැටුමක් සහ රුපියල් මිලියන 897 ක දළ ලාභයක් වාර්තා කර ඇත. බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභය රුපියල් මිලියන 370 ක් වූ අතර, බදු ගෙවීමෙන් පසු ලාභය රුපියල් මිලියන 259 ක් විය. 'විශේෂ ව්‍යාපෘති' යටතේ වූ අත්‍යවශ්‍ය ආහාර කොටසේ අඩු ක්‍රියාකාරිත්වය හේතුවෙන් සමස්ත පිරිවැටුම පහත වැටී තිබුණද, විනයෙන් යුතු පිරිවැය කළමනාකරණය මගින්, වැඩි දියුණු කළ ප්‍රසම්පාදන සැලසුම්කරණය මගින් සහ වඩා යහපත් වෙළඳපල ප්‍රතිචාරිත්වය මගින් මෙහෙයවන ලදුව, නිත්‍ය ව්‍යාපාරික මෙහෙයුම් පෙර වර්ෂයට සාපේක්ෂව 52% ක ශක්තිමත් වර්ධනයක් වාර්තා කර ඇත. විචක්ෂණශීලී මූල්‍ය කළමනාකරණය පිළිබිඹු කරමින් 2025 මාර්තු 31 දිනට සංස්ථාවේ ශුද්ධ වත්කම් රුපියල් මිලියන 6,185.75 ක් ව පැවතුණි.

රසායන ද්‍රව්‍ය හා ආශ්‍රිත නිෂ්පාදන, ගෙදරදොර නිෂ්පාදන, ඉදිකිරීම් හා දෘඩාංග ද්‍රව්‍ය, කෘෂිකාර්මික සැපයුම් හා යන්ත්‍රෝපකරණ, තොරතුරු සන්නිවේදන තාක්ෂණවේද නිෂ්පාදන, සහ විදුලි හා විද්‍යුත් නිෂ්පාදන ඇතුළු මුඛ්‍ය ව්‍යාපාරික අංශ සිසාරා ධනාත්මක මෙහෙයුම් කාර්යසාධනයක් වාර්තාගත කෙරුණි. වැඩිදියුණු කළ මූලාශ්‍රන උපායමාර්ග, වඩා සමීප සැපයුම්කාර සම්බන්ධීකරණය සහ කාර්යක්ෂම භාණ්ඩතොග පාලනය යන සාධක ආන්තික ස්ථාවරත්වයට සහ මෙහෙයුම් අවිච්ඡින්නතාවට දායක විය.

රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව සිය නිත්‍ය ව්‍යාපාරික මෙහෙයුම්වලට සමගාමීව, ජාතික ආහාර සුරක්ෂිතතාව සහ වෙළඳපල ස්ථායිතාව කෙරෙහි උර දීමේ සිය උපායමාර්ගික වගකීම අඛණ්ඩව ඉෂ්ට කර ඇත. රජයේ විධාන අනුව ක්‍රියාත්මක වෙමින් මෙම සංස්ථාව සහල්, බිත්තර, බඩඉරිඟු, උළු, පරිප්පු හා ලූණු වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කර බෙදා හැරිය අතර එමගින් වෙළඳපල ඇද වැටීම් කාලපරිච්ඡේද තුළ සැපයුම් අඛණ්ඩතාව සහතික වීම සහ මිල වාෂ්පශීලතාව සමනය කිරීම ඉටු විය.

ශක්තිමත් අභ්‍යන්තර පාලනවිධි සහ අවදානම් කළමනාකරණ පිළිවෙත් අප මෙහෙයුම්වල කේන්ද්‍රික අංග වශයෙන් පැවතුණි. ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතාවන්ට සහ මනා මූල්‍ය වාර්තාකරණයට අනුකූල වීමට අභ්‍යන්තර විගණන සමාලෝචන සහ විගණන කමිටුවේ අධීක්ෂණය ඉවහල් විය.

මෙහෙයුම්වලට සේවකයින්ගේ සහයෝගය නොමඳව ලැබුණු අතර වර්ෂය අවසන සේවක සංඛ්‍යාව 285 ක් ව පැවතුණි. කළමනාකාරිත්වය අඛණ්ඩව නිෂ්පාදන ඵලදායිතාව, වගවීම හා මෙහෙයුම් අවශ්‍යතාවන්ට සරිලන පරිදි ධාරිතා සංවර්ධනය කිරීම කෙරෙහි අවධාරණය යෙදීය.

අනාගතය පිළිබඳව සලකමින් කළමනාකාරිත්වය දැනට ඇති ව්‍යාපාරික ඛණ්ඩ වඩාත් යහපත් කිරීම, නිෂ්පාදන කළඹ පුළුල් කිරීම, ප්‍රදර්ශනාගාර කාර්යසාධනය වැඩිදියුණු කිරීම, විදුලි උපකරණ සඳහා දීප - ව්‍යාප්ත අලෙවිකාර ජාලය ස්ථාපිත කිරීම සහ අවශ්‍ය පරිදි අඛණ්ඩව රජය විසින් මෙහෙයවනු ලබන වෙළඳපල මැදිහත්වීම්වලට උරදීම කෙරෙහි සිය අවධානය යොමු කරනු ඇත.

සභාපතිතුමාගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ නායකත්වය, රේඛීය අමාත්‍යාංශයේ සහයෝගය සහ අපගේ සේවකයින්ගේ හා පාර්ශ්වකරුවන්ගේ ඇපකැප වීම මම ඉතාමත් ගෞරව පූර්වකව අගය කරමි.



**චමිලා ඉද්දමල්ගොඩ**

ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

**2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

සීමාසහිත රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය එහි 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ සමගින් ඒ පිළිබඳ විගණන වාර්තාව ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි.මෙම වාර්තාව 2007 අංක 07 දරන සමාගම් පනතට සහ වෙනත් අදාළ ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙළ කරනු ලැබේ.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

සමාලෝචිත වර්ෂය තුළ මෙම සමාගම මූලික වශයෙන් රජයේ ආයතන සහ රාජ්‍ය අංශ අස්තිත්වයන් වෙත භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීමේ සහ බෙදා හැරීමේ කටයුතුවල නියැලෙන රාජ්‍ය ව්‍යාපාරයක් ලෙස කටයුතු කිරීම අඛණ්ඩව සිදු කළේය. විශ්වාසය තැබිය හැකි සහ පිරිවැය කාර්යක්ෂම සැපයුම් දාම කළමනාකරණය හරහා මෙම සමාගම රාජ්‍ය අංශ මෙහෙයුම්වලට උපකාර කිරීමේ වැදගත් කාර්යභාරය ඉෂ්ට කරයි.

සිය රාජ්‍ය සේවා කාර්ය පැවරුමට අනුගතව, මෙම සමාගම වෙළඳපල සැපයුම් සහ මිල ගණන් ස්ථාවර කිරීම අරමුණු කර ගත් රජයේ විධානයන්ට ප්‍රතිචාර දක්වමින් සහල්, බිත්තර, බඩඉරිඟු, පරිප්පු හා ලුණු වැනි අත්‍යවශ්‍ය භාණ්ඩවල උපායමාර්ගික ආනයනකරු හා බෙදාහරින්නා වශයෙන් ද කටයුතු කළේ ය.

**මූල්‍ය කාර්යසාධන සමාලෝචනය**

2024/2025 මූල්‍ය වර්ෂය මෙහෙයුම් කාර්යක්ෂමතාව, මූල්‍ය විචක්ෂණභාවය සහ වර්ධිත වෙළඳපල ප්‍රතිචාරාත්මකතාව සහිත වසරක් විය.මූල්‍ය කාර්යසාධන සාරාංශය පහත පරිදි වේ.-

| මානය | 2024/2025 (රුපියල් මිලියන) |
|---|---|
| පිරිවැටුම | 8,787.08 |
| දළ ලාභය | 897.13 |
| බදු පෙර ශුද්ධ ලාභය | 370.00 |

වැඩි දියුණු කරන ලද ප්‍රසම්පාදන උපායමාර්ග සහ අලෙවි විවිධාංගීකරණය මගින් ශක්තිමත් කරන ලදුව මෙම සමාගම යහපත් ලාභ ආන්තිකයක් වාර්තා කර ඇත.විනයකින් යුතු පිරිවැය කළමනාකරණය සහ සුසංවිධිත මෙහෙයුම් මෙම ලාභදායිත්වයට තවදුරටත් ඉවහල් විය.

**ප්‍රාග්ධන ව්‍යුහය සහ ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම**

අදාළ මූල්‍ය වර්ෂය තුළ සමාගමේ ප්‍රාග්ධන ව්‍යුහයෙහි වෙනසක් සිදු වී නොමැත.සමාගමේ නිකුත් කරන ලද ප්‍රාග්ධනය රුපියල් මිලියන 100 ක පවතින අතර, එය රුපියල් 10/- බැගින් වූ සාමාන්‍ය කොටස් මිලියන 10 කින් සමන්විත ය. සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ නව කොටස් කිසිවකුත් නිකුත් කරනු නොලැබී ය.

සමාගමේ මූල්‍ය කාර්යසාධනය පිළිගැනීමට ලක් කරමින් සහ කොටස් හිමියන් වෙත සුදුසු ප්‍රතිලාභයක් ලැබෙන බවට සහතික කරමින් 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය එක් කොටසක් සඳහා රුපියල් 6.25 ක් වූ රුපියල් මිලියන 62.5 ක ලාභාංශයක් ප්‍රකාශයට පත් කරනුයේ සතුටිනි.

**ශුද්ධ වත්කම් සහ හානිකරණ ප්‍රතිපාදන**

2025 මාර්තු 31 දිනට සමාගමේ ශුද්ධ වත්කම් රුපියල් මිලියන 6,185.75 ක් ලෙස පැවතුණු අතර එමගින් ස්ථාවර මූල්‍ය තත්ත්වයක් සහ අඛණ්ඩ වටිනාකම් ජනනයක් පිළිබිඹු විය.

සමාගම "ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 36 - වත්කම් හානිකරණය" අනුව සමාගම සිය අයවිය යුතු දේ හා භාණ්ඩ තොග පිළිබඳ විස්තීර්ණ සමාලෝචනයක් සිදු කළේ ය. වර්ෂ පහ ඉක්මවා ඇති හිඟ හිටි වෙළඳ ණයගැතියන් සඳහා හානිකරණ ප්‍රතිපාදන වෙන් කරන ලදී.යම් ආපසු අයවීමක් සිදු වුව හොත් මේවා ආපසු හරවනු ලබන අතර, අදාළ කාලපරිච්ඡේදය සඳහා වන මූල්‍ය ප්‍රකාශ තුළ එයට සම්බන්ධ ගැලපුම් පිළිබිඹු කෙරෙනු ඇත.

**පාලනය සහ විගණන කමිටු**

සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුව සිව් වතාවක් රැස් විය.අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින මහා භාණ්ඩාගාර නියෝජිතයෙක් එහි සභාපති ලෙස අඛණ්ඩව කටයුතු කළේ ය.

කමිටුව.

- වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය හා අනුමත කළේ ය.
- අභ්‍යන්තර පාලනවිධි ක්‍රියාත්මක කිරීම හා ඒවාට අනුකූලව කටයුතු කිරීම නිරීක්ෂණය කළේ ය.
- මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලි, විගණන සොයාගැනීම් සහ අවදානම් කළමනාකරණ පිළිවෙත් ඇගයීය.

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විගණන ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රගතිය වාර්තා කළ අතර, අදාළ තැන්හිදී අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගන්නා ලදී.

**මානව සම්පත්**

2025 මාර්තු 31 දිනට සමාගම 285 දෙනකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් සේවයේ යෙදවූ අතර, ඔවුන්ගේ බෙදී යාම පහත පරිදි විය.

| ශ්‍රේණිය | සේවක සංඛ්‍යාව |
|---|---|
| ඉහළ කළමනාකාරිත්වය (HM) | 6 |
| මැදි කළමනාකාරිත්වය (MM) | 8 |
| කණිෂ්ඨ කළමනාකාරිත්වය (JM) | 14 |
| සෙසු කාර්යමණ්ඩල වර්ග | 257 |

මෙම සමාගම අඛණ්ඩ පුහුණුව, ධාරිතා සංවර්ධනය සහ කාර්යසාධනය - පාදක සංස්කෘතිය හරහා නිපුණ හා අභිප්‍රේරිත ශ්‍රම බලකායක් ගොඩනැංවීම කෙරෙහි ඇපකැප වී සිටී.

**ආයතනික සාමාජීය වගකීම (CSR)**

ආහාර සුරක්ෂිතතාව, මිල ස්ථායීකරණය සහ සියලු කලාපයන්හි අත්‍යවශ්‍ය භාණ්ඩවල ප්‍රවිෂ්ටය ආශ්‍රිතව රජයේ මූලකෘත්‍යයන්ට උර දීමේ සිය සාමාජීය බැඳීම් සමාජය අඛණ්ඩව දැරී ය.උපායමාර්ගික ආනයනයන් සහ ඉලක්කගත බෙදාහැරීම් හරහා සමාගම ජනතාවට නිසි කලට වේලාවට අත්‍යවශ්‍ය භාණ්ඩ ලබා ගැනීමට ඇති බවට සහතික විය.

**අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනවිධි**

සමාගමේ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා අවදානම් කළමනාකරණය ඉතා වැදගත් බව අධ්‍යක්ෂ මණ්ඩලය අවබෝධ කර ගෙන සිටී.සැපයුම් දාම බිඳවැටීම්, වෙළඳපල වාෂ්පශීලිතා සහ නියාමන අනුකූලතාව ඇතුළු මුඛ්‍ය අවදානම් ඉතා දෘඪතර අභ්‍යන්තර පාලනවිධි හා පාලන ව්‍යුහ හරහා සක්‍රීය ලෙසම නිරීක්ෂණය කරන ලදී.

**ව්‍යවස්ථාපිත විගණකවරු**

අදාළ ව්‍යවස්ථාමය රාමුවට අනුකූලව විගණකාධිපතිවරයා ව්‍යවස්ථාපිත විගණකවරයා ලෙස අඛණ්ඩව කටයුතු කරයි.2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලද අතර එතුමාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවට අන්තර්ගත කර තිබේ.

**පිළිගැන්වීම**

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දුන් අඛණ්ඩ සහයෝගය හා ප්‍රතිපත්ති මාර්ගෝපදේශකත්වය පිළිබඳව ශ්‍රී ලංකා රජයට ද, සිය කැපවීම හා වෘත්තීයවේදිත්වය සම්බන්ධයෙන් සියලුම සේවකයින්ට ද, අප කෙරෙහි තැබූ විශ්වාසය හා අඛණ්ඩ සම්බන්ධතාව සම්බන්ධයෙන් අපගේ අගනා ගනුදෙනුකරුවන්ට හා පාර්ශ්වකරුවන්ට ද අධ්‍යක්ෂ මණ්ඩලය සිය අවංක ස්තුතිය පළ කර සිටී.

අධ්‍යක්ෂ මණ්ඩලය සිය ව්‍යාපාරය පෞද්ගලික අංශය වෙත අවතීර්ණ වීම සඳහා ව්‍යාප්ත කිරීමට සක්‍රියවම ප්‍රයත්න දරන අතර, තිරසාර ලෙස වටිනාකම් ජනනය මෙහෙයවීම සහ රාජ්‍ය අංශයේ මුඛ්‍ය වෙළඳ හවුල්කරුවකු වශයෙන් වූ සිය කාර්යභාරය පවත්වා ගෙන යාම කෙරෙහි ඇපකැපව සිටී.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ

**ජේ. රවින්ද්‍ර ප්‍රනාන්දු**
සභාපති
රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව

**ආර්.එම්. විජේසිංහ බණ්ඩා**
අධ්‍යක්ෂ
රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ අංශ ප්‍රධානීන්

| ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය | නම |
|---|---|
| සභාපති/ කළමනාකරණ අධ්‍යක්ෂ | ජේ. රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| සාමාන්‍යාධිකාරී | චමිලා ඉද්දමල්ගොඩ මිය |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි | එම්. එන්. මහේෂ් මෙන්ඩිස් මහතා |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය | අයි. එම්. ඩී. කේ. ඉලංගසිංහ මිය |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - පරිපාලන | සඳරුවන් පෙරේරා මහතා |
| සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවි ප්‍රවර්ධන | රසික ඇපාසිංහ මහතා |
| සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය | චතුර ගයාන් පෙරේරා මහතා |
| සහකාර සාමාන්‍යාධිකාරී - පරිපාලන | නිරෝෂ් බණ්ඩාර මහතා |

## අංශ ප්‍රධානීන්

**රසායන ද්‍රව්‍ය හා ආශ්‍රිත නිෂ්පාදන අංශය**
කළමනාකරු — කේ. එච්. ගුණවර්ධන මහතා

**කාර්යාල උපකරණ සැපයුම් අංශය**
කළමනාකරු — නිමල්කා රණසිංහ මිය

**ගෘහ උපකරණ අංශය**
කළමනාකරු — ගයාන් බෝගහවත්ත මහතා

**තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය**
සහකාර කළමනාකරු — මධුක බණ්ඩාර මහතා

**විදුලි හා විද්‍යුත් උපකරණ අංශය**
කළමනාකරු — කේ. ජී. සී. ජනක මහතා

**කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ හා උපකරණ අංශය**
කළමනාකරු — මධුශානි අකුරුගොඩ මිය

**ඉදිකිරීම්, ලෝහ භාණ්ඩ සහ කාර්යාල ගෘහභාණ්ඩ අංශය**
සහකාර කළමනාකරු — අනුරුද්ධ මහේෂ් මහතා

**වාහන නිපැයුම් අංශය**
සහකාර කළමනාකරු — ඩී. ප්‍රදීප් කුමාර මහතා

**පාරිභෝගික භාණ්ඩ අංශය**
සහකාර කළමනාකරු — ඩී. ප්‍රදීප් කුමාර මහතා

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ අංශ ප්‍රධානීන්

| අංශ ප්‍රධානීන් | නම |
|---|---|
| **තීරු බදු රහිත වෙළඳ අංශය** | |
| සහකාර කළමනාකරු | කේ. ජී. සී. ජනක මහතා |
| **ප්‍රසම්පාදන අංශය** | |
| කළමනාකරු | ධනුෂ්ක පුෂ්පකුමාර මහතා |
| **මූල්‍ය අංශය** | |
| කළමනාකරු | අයි. කේ. පී. ජී. පෙරේරා මිය |
| කළමනාකරු (වැඩ බලන) | පී. ආර්. ඩී. පීරිස් මිය |
| සහකාර කළමනාකරු | එම්. ඊ. ඉලිපන්ගමුව මෙනෙවිය |
| **තොරතුරු තාක්ෂණ අංශය** | |
| සහකාර සාමාන්‍යාධිකාරී - පරිපාලන | නිරෝෂ් බණ්ඩාර මහතා |
| **සේවා සහ සැපයුම් අංශය** | |
| සහකාර කළමනාකරු | කේ. එච්. අනුපමා පීරිස් මිය |
| **විගණන අංශය** | |
| සහකාර කළමනාකරු - අභ්‍යන්තර විගණන | එම්. මදූෂා අමාලි ඩයස් මිය |
| **මානව සම්පත් හා නීති අංශය** | |
| කළමනාකරු - මානව සම්පත් | දර්ශනා පතිරණ මිය |
| **ශාඛා සහ ප්‍රදර්ශනාගාර** | |
| 01. නවම් මාවත ප්‍රදර්ශනාගාරය | අංක 100, නවම් මාවත, කොළඹ 02. |
| 02. කුරුණෑගල ප්‍රදර්ශනාගාරය | අංක 243/3/1, පුත්තලම් පාර, කුරුණෑගල. |
| 03. මහනුවර ප්‍රදර්ශනාගාරය | අංක 449, විලියම් ගොපල්ලව මාවත, නුවර. |
| 04. මාතර ප්‍රදර්ශනාගාරය | අංක 11, YMCA ගොඩනැගිල්ල, දුම්රියපල පාර, මාතර. |
| 05. අනුරාධපුර ප්‍රදර්ශනාගාරය | අංක 561- B, 38 4 වෙනි පටුමග, අනුරාධපුර |
| 06. යාපනය ප්‍රදර්ශනාගාරය | අංක 127, MPCS ගොඩනැගිල්ල, කන්කසන්තුරේ පාර, යාපනය |
| 07. මඩකලපුව ප්‍රදර්ශනාගාරය | අංක 32A සහ 32B, නව කල්මුනේ පාර, මඩකලපුව. |

# සංවිධාන ව්‍යුහය


සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ
සාමාන්‍යාධිකාරී
HM- ඉහළ කළමනාකාරිත්වය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිපාලන)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි ප්‍රවර්ධන)
සහකාර සාමාන්‍යාධිකාරී (පරිපාලන)
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)
සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි ප්‍රවර්ධන)
MM- ජ්‍යෙෂ්ඨ කළමනා-කාරිත්වය
අභ්‍යන්තර විගණක
කළමනාකාර (පරිපාලන)
කළමනාකාර (මුදල්)
කළමනාකාර (අලෙවි ප්‍රවර්ධන)
JM -කණිෂ්ට කළමනා-කාරිත්වය
සහකාර අභ්‍යන්තර විගණක
සහකාර කළමනාකාර (පරිපාලන)
සහකාර කළමනාකාර (මුදල්)
සහකාර කළමනාකාර (අලෙවි ප්‍රවර්ධන)
ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරී
නීති නිලධාරී
කළමනාකරණසහකාර (අධිශ්‍රේණිය)
කළමනාකරණ සහකාර (අධිශ්‍රේණිය)
කළමනාකරණ සහකාර (අධිශ්‍රේණිය)
MA - කළමනා-කරණ සහකාර
කළමනාකරණ සහකාර / විගණන සහකාර
කළමනාකරණ සහකාර/පිළිගැනීමේ නිලධාරි/ගිණුම් සහකාර/ විකිණීම් ප්‍රවර්ධන සහකාර
කළමනාකරණ සහකාර/අයකැමි/ ණය අයකරු/ ගිණුම් සහකාර
කළමනාකරණ සහකාර/අයකැමි/ ණය අයකරුවිකිණීම් ප්‍රවර්ධන සහකාර
ආරක්ෂක නිලධාරි/ ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි
PL 3 - ප්‍රාථමික පුහුණු - 3 මට්ටම
රියැදුරු
PL 2 - ප්‍රාථමික පුහුණු - 2 මට්ටම
විදුලි කාර්මික/වඩු කාර්මික/ තොරතුරු තාක්ෂණ සහකාර/ තොරතුරු තාක්ෂණ දෘඩාංග සහකාර
වායුසමන තාක්ෂණ ශිල්පී/ තොරතුරු තාක්ෂණ සහකාර/ තොරතුරු තාක්ෂණ දෘඩාංග සහකාර
PL 1 - ප්‍රාථමික පුහුණු - 1 මට්ටම
කාර්යාල සහායක/ කාර්ය සහකාර
ගබඩා සහකාර/ කාර්යාල සහායක/ කාර්ය සහකාර/ නඩත්තු සහකාර / විකිණීම් සහකාර/ පණිවුඩකරු
කාර්යාල සහායක/ කාර්ය සහකාර
ගබඩා සහකාර/ කාර්යාල සහායක/ කාර්ය සහකාර/ නඩත්තු සහකාර / විකිණීම් සහකාර/ පණිවුඩකරු
කණිෂ්ට ආරක්ෂක නිලධාරි
කාර්ය සහකාර

# අපේ නිෂ්පාදන කළඹ

## කාර්යාල සැපයුම් හා උපකරණ

ඩබල් A සහ අනෙකුත් ඡායා පිටපත් කඩදාසි, පුවරු, කඩදාසි වර්ග, පොතේ, ෆයිල් කවර හා ෆෝල්ඩර, ලියුම් කවර, කාර්යාල බෑග් සහ බ්‍රීෆ්කේස්, පෑන් සහ පැන්සල්, වයිට් බෝඩ්, සලකුණු කිරීමේ පෑන්, කතුරු, කඩදාසි කැපීමේ පිහි සහ කඩදාසි තිරු කිරීමේ යන්ත්‍ර, කැල්කියුලේටර, ස්ටේප්ලර් සහ සිදුරු කරන, සීඩී තැටි සහ ඩීවීඩී තැටි, යූ එස් බී ඩ්‍රයිව් සහ අනෙකුත් ලිපි ද්‍රව්‍ය.





## ගෘහ උපකරණ

ඇළුමිනියම් භාණ්ඩ, පෝසිලේන් නිෂ්පාදන, නන්ස්ටික් මුළුතැන්ගෙයි භාණ්ඩ, සියලු අකාරයේ පිරිසිදු කිරීමේ නිෂ්පාදන, ක්‍රීඩා භාණ්ඩ, සියලු ආකාරයේ ප්ලාස්ටික් නිෂ්පාදන, කෝප්ප සහ පීරිසි, හැඳි ගෑරුප්පු පිහි ආදිය සහ පිඟාන් බඩු, කේතල සහ ජෝග්ගු, රාක්ක සහ බන්දේසි, උණු වතුර බෝතල්, ජල පෙරණ සහ පිරිසිදුකාරක, කොට්ට, මෙට්ට සහ ඇඳ ඇතිරිලි, රබර් සහ කොහු පාපිසි, කිරුම් උපකරණ, වැහි කබා සහ කුඩ, අත්පිස්නා, කඩදාසි අත්පිස්නා, අනෙකුත් කඩදාසි නිෂ්පාදන සහ බිත්ති ඔරලෝසු.

## තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන උපාංග

ලැප්ටොප් පරිගණක, ඩෙස්ක්ටොප් පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, ස්කෑන් යන්ත්‍ර, යුපීඑස්, ඡායා පිටපත් යන්ත්‍ර, අනෙකුත් පරිගණක උපාංග.





## විදුලි සහ විද්‍යුත් උපාංග

වායු සමීකරණ යන්ත්‍ර. KDK විදුලි පංකා, ඩිජිටල් කැමරා (නිශ්චල,වීඩියෝ) සහ දීප්තිමත් ආලෝක බල්බ, බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ තිර, ගෘහස්ථ හා එළි මහන් ස්පීකර, ඕඩියෝ ඇම්ප්ලිෆයර, මික්සර් සහ මයික්‍රොෆෝන, විදුලි උත්පාදක යන්ත්‍ර, ප්‍රවේශ පාලන පද්ධති, CCTV පද්ධති, ඇඟිළි සලකුණු යන්ත්‍ර , විදුලි පහන් (CFL, ෆ්ලොරසන්ට්) සහ හදිසි අවස්ථා ලාම්පු, දුරකථන, විදුලි රැහැන් ඇදීමේ උපාංග, අනෙකුත් විදුලි උපාංග

# අපේ නිෂ්පාදන කළඹ

**වේගයෙන් අලෙවි වන පාරිභෝගික භාණ්ඩ**

ගෙදර දොර සෞඛ්‍ය පවත්වා ගැනීමට අවශ්‍ය නිෂ්පාදන, පුද්ගල සනීපාරක්ෂක භාණ්ඩ සහ ආහාර





ටයර් සහ වාහන බැටරි

EXIDE
APOLLO DUNLOP PIRELLI
YOKOHAMA NANKANG

**කෘෂිකර්ම උපකරණ, යන්ත්‍රෝපකරණ මෙවලම් සහ ලෝහ භාණ්ඩ**

කටු කම්බි, පඳුරු කපන යන්ත්‍ර, තණකොළ කපන යන්ත්‍ර, වෑද්දුම් ට්‍රාල්ෆෝමර, කැති සහ පිහි, සියලු වර්ගයේ බල මෙවලම්, සියලු වර්ගයේ අත් මෙවලම්, ජල පොම්ප, ආරක්ෂිත උපකරණ (හිස් ආවරණ, අත්වැසුම් සහ බූට් වර්ග), මුල්ලු, අලවංගු, සවල් සහ රේක්ක, පොලිතින් සීලර්, ධූමන යන්ත්‍ර.



# අපේ නිෂ්පාදන කළඹ

**අභ්‍යන්තර සැලසුම් නිර්මාණ සහ කාර්යාල ගෘහ භාණ්ඩ**

වානේ ගෘහ භාණ්ඩල (පුටු, මේස, කබඩි, කැබිනට්, පොත් රාක්ක) දැව ගෘහ භාණ්ඩ (පුටු, මේස, කබඩි, කැබිනට්, පොත් රාක්ක) මෙලමයින් ගෘහ භාණ්ඩ (පුටු, මේස, කබඩි, කැබිනට්, පොත් රාක්ක)







**රසායන ද්‍රව්‍ය**

කර්මාන්ත රසායන ද්‍රව්‍ය, පරීක්ෂණාගාර රසායන ද්‍රව්‍ය, විශේෂ රසායන ද්‍රව්‍ය, තෝරා ගත් පුපුරණ රසායන ද්‍රව්‍ය

**තීරු බදු රහිත සාප්පුව**

විදේශිකයින් සඳහා අවශ්‍ය පහසුකම් සපයයි.












අත්‍යාවශ්‍ය ආහාර

# ව්‍යාපාර සමාලෝචනය

### විකුණුම් වර්ධනය (රු. මිලියන)




### ආදායම් බදු වලට පසු ශුද්ධ ලාභය (රු. මිලියන)



# රැකියා උත්පාදනය

## 2020 - 2025

### 2020/2021 සිට 2024/2025 දක්වා රැකියා උත්පාදනය

**2020 - 2021**

පරිපාලනය සහ ඒ ආශ්‍රිත අනෙකුත් සේවකයන් 169

වෙළඳ කටයුතු හා සම්බන්ධ සේවකයන් 205

මුළු සේවකයන් 374

**2021 - 2022**

පරිපාලනය සහ ඒ ආශ්‍රිත අනෙකුත් සේවකයන් 185

වෙළඳ කටයුතු හා සම්බන්ධ සේවකයන් 207

මුළු සේවකයන් 392

**2022 - 2023**

පරිපාලනය සහ ඒ ආශ්‍රිත අනෙකුත් සේවකයන් 154

වෙළඳ කටයුතු හා සම්බන්ධ සේවකයන් 182

මුළු සේවකයන් 336

**2023 - 2024**

පරිපාලනය සහ ඒ ආශ්‍රිත අනෙකුත් සේවකයන් 171

වෙළඳ කටයුතු හා සම්බන්ධ සේවකයන් 129

මුළු සේවකයන් 300

**2024 - 2025**

පරිපාලනය සහ ඒ ආශ්‍රිත අනෙකුත් සේවකයන් 166

වෙළඳ කටයුතු හා සම්බන්ධ සේවකයන් 119

මුළු සේවකයන් 285

# ආයතනික පාලනය

පාලන ව්‍යුහය සහ යහපත් ව්‍යාපාරික පරිචයන් යළි පණ ගැන්වීමට පසුගිය වසර තුළ කළමනාකාරීත්වය ප්‍රයත්න දරන ලදී. ඊට අමතරව, සංස්ථාව සතුව වෙනම විගණන අංශයක් ඇති අතර මනා පාලන පරිසරයක් සහතික කිරීම පිණිස අභ්‍යන්තර පාලන ස්ථාපිත කර තිබේ. තවද, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන වෙනම විගණන හා කළමනාකරණ කමිටුවක් තිබේ. රජයේ ප්‍රසම්පාදන පටිපාටිය අනුව ප්‍රසම්පාදන යාන්ත්‍රණය අධීක්ෂණය සහ පාලනය පිණිස ටෙන්ඩර් මණ්ඩලයක් ස්ථාපිත කොට ඇත.

**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෝ**

**සභාපති / ක.අ.**
ජේ. රවීන්ද්‍ර ප්‍රනාන්දු
(2024.11.08 සම්බන්ධ විය)

**ආර්. එම්. ඩබ්ලිව්. බණ්ඩා**
අධ්‍යක්ෂ

**ජේ. ඒ. අයි. ඒ. පෙරේරා මිය**
අධ්‍යක්ෂ

**එල්. ටී. එස්. ප්‍රියන්ත මහතා**
අධ්‍යක්ෂ

**අයි. ඒ. ගුණවර්ධන මහතා**
අධ්‍යක්ෂ

**ඊ. එස්. මල්ලවආරච්චි මහතා**
අධ්‍යක්ෂ

**ජේ. එන්. නානායක්කාර මහතා**
අධ්‍යක්ෂ

**විගණන කමිටු සාමාජිකයෝ**

**ආර්. එම්. ඩබ්ලිව්. බණ්ඩා**
කමිටු සභාපති

**ජේ. ඒ. අයි. ඒ. පෙරේරා මිය**
අධ්‍යක්ෂ

**ජේ. එන්. නානායක්කාර මහතා**
අධ්‍යක්ෂ

2024/2025 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දහතුනක් (13) සහ විගණන කමිටු රැස්වීම් හතරක් (4) පවත්වා ඇත.

**ව්‍යාපාර කළමනාකරණ මෙවලම් පැවැතීම**



1. ආයතනික සැලැස්ම 2025/2030
2. වාර්ෂික වාර්තාව 2024/2025
3. STC ප්‍රසම්පාදන පටිපාටිය
4. STC ක්‍රියාකාරී සැලැස්ම
5. STC නිෂ්පාදන කළඹ
6. STC පැතිකඩ
7. STC ණයට විකුණුම් ප්‍රතිපත්ති
8. තොග පාලන ප්‍රතිපත්තිය
9. STC අනුමත සේවක සංඛ්‍යාව

# විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව

**2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ කමිටුවේ වාර්තාව**

රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අංක PED/55 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය යටතේ සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කරන ලද්දේ අධ්‍යක්ෂ මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය, අවදානම් කළමනාකරණය සහ ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතාවන්ට අනුකූල වීම ආශ්‍රිත වගකීම් ඉෂ්ට කිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වනු පිණිස ය. මෙම කමිටුව සංස්ථාවෙහි මූල්‍ය ප්‍රකාශයන්හි නිවැරදි බව, අභ්‍යන්තර පාලන විධීන්හි කාර්යක්ෂමතාව සහ අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ගයන්හි ප්‍රමාණවත් බව සහතික කරන ස්වාධීන අධීක්ෂක ආයතනයක් ලෙස ක්‍රියා කරයි.

සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ, කමිටුවෙහි සංයුතිය පහත පරිදි වෙනස් විය.

| කාලපරිච්ඡේදය | නම | තනතුර |
|---|---|---|
| 2024 අප්‍රේල් 1 දින සිට<br>2025 ජනවාරි 15 දින දක්වා | සත්‍ය කුමාර් මහතා<br>ගිල්මා දහනායක මහත්මිය<br>දුලාන් ආසිරි හෙට්ටිආරච්චි මහතා | සභාපති<br>කමිටු සාමාජික<br>කමිටු සාමාජික |
| 2025 ජනවාරි 15 දින සිට | ආර්.එම්.ඩබ්ලිව්. බණ්ඩා මහතා<br>ජේ.එන්.එන්. නානායක්කාර මහතා<br>ජේ.වී.අයි.වී. පෙරේරාමහතා | සභාපති<br>කමිටු සාමාජික<br>කමිටු සාමාජික |

රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා සහ විගණන අධිකාරිවරයා අවශ්‍ය පරිදි පැහැදිලි කිරීම් සහ යාවත්කාලීන කිරීම් ලබා දීම පිණිස ආරාධිතයින් ලෙස රැස්වීම්වලට සහභාගි වූහ. කමිටුව විසින් මෙම වර්ෂය සඳහා වූ සිය රැස්වීම් හතර පවත්වනු ලැබූ අතර සාකච්ඡා මත පදනම් වූ නිර්දේශ ඉදිරි ක්‍රියාමාර්ග සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිසි ලෙස ඉදිරිපත් කරන ලදී.සාමාජිකයන්ගේ පැමිණීම හා සහභාගිත්වය සතුටුදායක මට්ටමක පැවති අතර ඒ අනුව ඔවුහු කමිටුවේ කාර්ය කෙරෙහි සාමාජිකයන්ගේ ඇපකැපවීමෙහි සැබෑ පිළිබිඹුවක් වූහ.

කමිටුව සිය රාජකාරි ඉෂ්ට කිරීමෙහිලා ආයතනයෙහි මූල්‍ය ප්‍රකාශයන්හි නිරවද්‍යතාව, සන්සන්දනීයත්වය සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හා වෙනත් අදාළ ප්‍රමිති සමග ඒවායේ අනුකූලතාව සමාලෝචනයට ලක් කලේය. මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කිරීමට පෙර කමිටුව සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති, ඇස්තමේන්තු සහ ගැලපුම් පිළිබඳව කළමණාකාරිත්වය සමග සහ බාහිර විගණකවරුන් සමග සාකච්ඡා කලේය.

කමිටුව අභ්‍යන්තර පාලනවිධිවල හා අවදානම් කළමනාකරණ පද්ධතිවල සඵලදායී බව සහ පූර්ණ බව පිළිබඳව විශේෂයෙන් අවධාරණය කළේ ය. නිරීක්ෂණය කරන ලද දුර්වලතා කළමනාකාරිත්වය විසින් කාලෝචිත ලෙස ආමන්ත්‍රණය කරනු ලබන්නේදැයි නිශ්චය කරනු පිණිස කමිටුව අභ්‍යන්තර විගණන සැලසුම්, වාර්තා සහ පසු ක්‍රියාමාර්ග සමාලෝචනයට ලක් කළේ ය.එමෙන්ම මෙම කමිටුව අභ්‍යන්තර විගණන අංශයේ කාර්යසාධනය සහ ස්වාධීනත්වය පිළිබඳව සමාලෝචනය කළ අතර එම අංශය සිය කාර්ය පැවරුමෙහි නිසි ක්‍රියාකාරිත්වය සඳහා ප්‍රමාණවත් සම්පත් භාවිතා කර ඇති බව නිශ්චය කළේ ය.

සිය විගණනයේ සැලැස්ම, කාර්ය පථය සහ සුවිශේෂී සොයාගැනීම් සමීප ලෙස ආමන්ත්‍රණය කරනු පිණිස කමිටුව බාහිර විගණකවරයා යෙදවීය.විගණයෙන් ලද නිරීක්ෂණ, කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සාකච්ඡාවට ලක් කරන ලදී.එමෙන්ම කමිටුව බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය හා වාස්තවික බව සත්‍යාපනය කළ අතර ඔවුන් යලි පත් කිරීම සහ පාර්ශ්‍රමික පිළිබඳව අවශ්‍ය පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කළේ ය.

නීති රීති, රෙගුලාසි, චක්‍රලේඛ හා අභ්‍යන්තර ප්‍රතිපත්ති මෙම වර්ෂයේ ප්‍රමුඛ අවධාන ක්ෂේත්‍ර විය.නියාමන අනුකූලතාව පිළිබඳ වාර්තා සමාලෝචනය කළ මෙම කමිටුව යම් අපගමනයන් වේ නම් ඒවා වසා දැමීම පිණිස කළමනාකාරිත්වය විසින් නිසි පියවර ගන්නා බවට සහතික විය.සංස්ථාවේ සියලු ක්‍රියාකාරකම්වලදී සංස්ථායික තන්ත්‍රණය, චර්යාධර්මානුකූල ක්‍රියාකලාපය සහ විනිවිදභාවය පිළිබඳ ඉහළ ප්‍රමිති පවත්වා ගැනීමෙහි වැදගත්කම කමිටුව විසින් අවධාරණය කරන ලදී.

වර්ෂය තුළ කමිටුව මෙහෙයුම් සඵලදායිත්වය වැඩිදියුණු කිරීම, අභ්‍යන්තර පාලනවිධි ස්ථාපිත කිරීම සහ වගවීම ඉහළ නැංවීම සඳහා නිර්දේශ කිහිපයක් ලබා දුනි.කළමනාකාරිත්වය විසින් සිය නිර්දේශ නිසි ලෙස සලකා බලා ක්‍රියාවට නංවනු ඇතිය යන්න කමිටුවේ විශ්වාසයයි. කමිටුව විසින් සිය කාර්යසාධනය පිළිබඳව ස්වයං තක්සේරුවක් සිදු කරනු ලැබූ අතර, ප්‍රඥප්තියේ දක්වා ඇති පරිදි සිය වගකීම් සඵලදායී ලෙස ඉෂ්ට කර ඇති බව තහවුරු කර ගන්නා ලදී.

මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින් විගණන හා කළමනාකරණ කමිටුව සිය කාර්ය ඉෂ්ට කිරීම සඳහා වර්ෂය මුළුල්ලේම ලැබුණු උපකාර හා සහයෝගය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකාරිත්වය, අභ්‍යන්තර විගණන අංශය සහ බාහිර විගණකවරුන් වෙත සිය කෘතඥතාව පළ කර සිටී.



**ආර්.එම්.ඩබ්ලිව්. බණ්ඩා**
සභාපති, විගණන හා කළමනාකරණ කමිටුව
රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව

# විශේෂ මූල්‍ය සිදුවීම්

| | 2024/2025 (රු. 000) | 2023/2024 (රු. 000) | වෙනස% ↑ / ↓ |
|---|---|---|---|
| **මෙහෙයුම්** | | | |
| පිරිවැටුම | 8,787,080 | 12,132,030 | -28% |
| පොළී සහ බදුවලට පෙර ඉපැයුම් | 240,288 | 1,295,856 | -81% |
| බදු පෙර ලාභය | 369,999 | 1,501,215 | -75% |
| බදු පසු ලාභය (ප්‍රත්‍යාගණන ලාභයට පෙර) | 258,897 | 966,169 | -73% |
| **ශේෂ පත්‍රය** | | | |
| ජංගම නොවන වත්කම් | 4,083,879 | 4,149,101 | -2% |
| ජංගම වත්කම් | 4,375,029 | 4,469,480 | -2% |
| ජංගම වගකීම් | 2,023,711 | 2,258,283 | -10% |
| ජංගම නොවන වගකීම් | 249,450 | 190,635 | 31% |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය සහ සංචිත | 6,185,747 | 6,169,663 | 0.26% |
| **මුදල් ප්‍රවාහය** | | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදිත ශුද්ධ මුදල් | 223,021 | (1,078,218) | -121% |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල් | (237,388) | (1,377,136) | -83% |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් උත්පාදිත ශුද්ධ මුදල් | 211,304 | 351,599 | -40% |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් උත්පාදිත ශුද්ධ මුදල් | 13,884 | 836,298 | -98% |
| **කොටසක් සඳහා දත්ත** | | | |
| කොටසක ඉපැයුම් | 26 | 97 | -73% |
| කොටසක ශුද්ධ වත්කම් | 619 | 617 | 0.26% |
| හිමිකම් මත ඵලය (ROE) | 12% | 44% | -32% |
| වත්කම් මත ඵලය (ROA) | 3% | 14% | -11% |
| **වැදගත් අනුපාත** | | | |
| දළ ලාභ අනුපාතය | 10% | 16% | -6% |
| ශුද්ධ ලාභ අනුපාතය | 4% | 12% | -8% |
| ක්ෂණික අනුපාතය | 1.39 | 1.50 | -7% |
| ජංගම අනුපාතය | 2.16 | 1.98 | 9% |
| තෝලන අනුපාතය | 4% | 3% | 1% |

# විශේෂ මූල්‍ය සිදුවීම් ප්‍රස්ථාරික නිරූපණය

### පිරිවැටුම

| වර්ෂය | (රු. මිලියන) |
|---|---|
| 15/16 | 2949 |
| 16/17 | 3749 |
| 17/18 | 4334 |
| 18/19 | 3474 |
| 19/20 | 2454 |
| 20/21 | 2677 |
| 21/22 | 8750 |
| 22/23 | 9417 |
| 23/24 | 12132 |
| 24/25 | 8787 |




### බදු පූර්ව ශුද්ධ ලාභය

| වර්ෂය | (රු. මිලියන) |
|---|---|
| 15/16 | 31 |
| 16/17 | 45 |
| 17/18 | 88 |
| 18/19 | -31 |
| 19/20 | -121 |
| 20/21 | 60 |
| 21/22 | 473 |
| 22/23 | 735 |
| 23/24 | 1501 |
| 24/25 | 370 |




### මුළු වත්කම

| වර්ෂය | (රු. මිලියන) |
|---|---|
| 15/16 | 2694 |
| 16/17 | 2650 |
| 17/18 | 2994 |
| 18/19 | 2796 |
| 19/20 | 2493 |
| 20/21 | 2515 |
| 21/22 | 5917 |
| 22/23 | 4846 |
| 23/24 | 8619 |
| 24/25 | 8459 |



### ශුද්ධ වත්කම

| වර්ෂය | (රු. මිලියන) |
|---|---|
| 15/16 | 707 |
| 16/17 | 759 |
| 17/18 | 820 |
| 18/19 | 786 |
| 19/20 | 651 |
| 20/21 | 701 |
| 21/22 | 1131 |
| 22/23 | 1782 |
| 23/24 | 6170 |
| 24/25 | 6186 |









# සංස්ථාවේ වෙළඳ අංශයන්හි කාර්යසාධනය

## ආදායම් උත්පාදකයන් 2024 - 2025




## ආදායම් උත්පාදකයන්ගේ කාර්යසාධනය 2024/2025

| අංශය | විකුණුම් |
|---|---|
| රසායන ද්‍රව්‍ය | 1,263,693,019 |
| තො.ස.තා. | 988,771,257 |
| කාර්යාලීය සැපයුම් | 534,928,051 |
| මෝටර් රථ අංශය | 213,870,543 |
| තීරු බදු රහිත සාප්පුව | 1,215,532 |
| විද්‍යුත් සහ විදුලි උපකරණ | 278,967,805 |
| වේගයෙන් අලෙවි වන පාරිභෝගික භාණ්ඩ | 109,009,685 |
| ගෘහ උපකරණ | 328,282,822 |
| ඉදිකිරීම් ද්‍රව්‍ය | 301,071,664 |
| කෘෂි යන්ත්‍රෝපකරණ හා උපකරණ | 331,926,152 |
| ස්වශක්ති (වාහන බැටරි) | 112,259,109 |
| අත්‍යාවශ්‍ය ආහාර, විශේෂ ව්‍යාපෘති අංශය | 4,323,084,449 |
| **එකතුව** | **8,787,080,088** |

## වෙළඳ අංශ කාර්යසාධනය සංසන්දනය (2023 - 2024 / 2024 - 2025)

| දෙපාර්තමේන්තු | 2023/2024 | 2024/2025 | % ↑/↓ |
|---|---|---|---|
| ර.ද්‍ර. | 678,199,226 | 1,263,693,019 | 86% |
| තො.ස.ත | 660,086,111 | 988,771,257 | 50% |
| කා.සැ. | 393,593,416 | 534,928,051 | 36% |
| මෝ.ර. | 229,435,930 | 213,870,543 | -7% |
| තී.බ.ර. සාප්පු | 11,575,579 | 1,215,532 | -89% |
| වි.වි. උපකරණ | 185,825,373 | 278,967,805 | 50% |
| වෛ.අ.පා. භාණ්ඩ | 127,302,765 | 109,009,685 | -14% |
| ගෘ. උ. | 167,150,581 | 328,282,822 | 96% |
| ඉදිකිරීම් ද්‍රව්‍ය | 175,294,346 | 301,071,664 | 72% |
| කෘෂි. යන්ත්‍ර හා උපකරණ | 198,860,067 | 331,926,152 | 67% |
| ස්වශක්ති (වාහන බැටරි) | 103,679,769 | 112,259,109 | 8% |
| අ.ආ, වි.ව.අ. | 9,201,026,543 | 4,323,084,449 | -55% |
| **එකතුව** | **12,132,029,706** | **8,787,080,088** | **-29%** |

## වෙළඳ අංශයන්හි ආදායම් සංසන්දනය



# විගණකාධිපති වාර්තාව

## ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } වීඑම්/ඒ/එස්ටීසී/එෆ්ඒ/2024/25/39 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2025 සැප්තැම්බර් [illegible] දින

සභාපති,

සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව.

**සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාවෙහි 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාවේ ("සමාගම") 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවට සභාගත කරනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

## 1.3 සමාගමේ 2024/ 2025 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සමාගමේ 2024/2025 කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම් අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා, දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පදනම වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීති, රීති, විධානයට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය | අභ්‍යන්තර විගණක තනතුර 2020 නොවැම්බර් 12 දින සිට පුරප්පාඩුව පැවතිය ද, අදාළ තනතුර පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි. |
| (ආ) | අංක PED 1/2015 දරන 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2023 ඔක්තෝබර් 05 දිනැති අංක | චක්‍රලේඛ විධිවිධානවලට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර තිබූ ප්‍රතිපූර්ණ ක්‍රමවේදයට පටහැනිව නිලවාහන සඳහා හිමිකම් නොමැති නිලධාරීන් 30 දෙනෙකුට සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් දෙදෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.2,820,000 ක් හා රු.60,000 ක් |

4

| | | |
|---|---|---|
| | PED/S/STC/03/11(i) දරන ලිපිය | ප්‍රවාහන දීමනා ලෙස ගෙවා තිබුණි. |
| (ඇ) | 2022 දෙසැම්බර් 21 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 08/2022 | සේවකයන් සඳහා ඉතිරි කර ගත් නිවාඩු මත දීමනා ගෙවීමේදී සේවකයින්ට හිමි නිවාඩු ගණනය කිරීමේදී 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනතේ විධිවිධානවලට පටහැනි ලෙස වර්ෂයකදී ලබාගත හැකි නිවාඩු දින ගණන 21 වෙනුවට 42 ක් ලෙස සලකා කටයුතු කර සමාලෝචිත වර්ෂයේ නිවාඩු මත දීමනා ලෙස රු.9,497,982 ක් ගෙවා තිබුණි. |
| (ඈ) | 2024 දෙසැම්බර් 23 දිනැති අංක PED 03/2024 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 1.3 ඡේදය | 2023/2024 මූල්‍ය වර්ෂය තුළ ලාභ උපයා ඇති නමුත් බදු පසු ලාභයෙන් අවම වශයෙන් සියයට 30 ක් ඒකාබද්ධ අරමුදලට ලාභාංශ ලෙස ගෙවා නොමැති රාජ්‍ය ව්‍යාපාර ලාභදායීත්වය සඳහාම කරගෙන කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනා ගෙවීමට හිමිකම් නොලැබුවද සමාගම 2023/2024 වර්ෂයේදී උපයන ලද ලාභයෙන් සියයට 16 ක පමණ ලාභාංශ ගෙවා තිබියදී එම කාලපරිච්ඡේදයට අදාලව සේවකයින් 259 දෙනකුට රු.5,180,000 ක ප්‍රසාද දීමනා සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. |
| (ඉ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක PED 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යවසායන් සඳහා වූ මෙහෙයුම් අත්පොතේ | |
| | (i) 3.2 (ii) ඡේදය | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය සඳහා රු.8,815,474 ක් සේවකයන්ට ගෙවා තිබුණි. |
| | (ii) 6.7 ඡේදය | ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති රු.4,405,033,179 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් 2017 වර්ෂයෙන් පසුව භෞතික සත්‍යාපන සිදුකර නොතිබුණි. |
| (ඊ) | 2024 පෙබරවාරි 28 දිනැති අංක 01/2024 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ හි 5.1 ඡේදය | සේවක සුභසාධක සමිති හා අනෙකුත් සුභසාධන කටයුතු සඳහා සමාගමේ අරමුදල් භාවිතා නොකළ යුතු වුවද වුවද සමාලෝචිත වර්ෂයේ අවස්ථා 8 ක දී ඒකතුව රු.806,500 ක් සුභසාධන වැනි කටයුතු සඳහා වැයකර තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ද) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ළ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.5 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නම් කළ යුතු වුවද සමාගමේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සභාපති විසින් පත්කර තිබූ අතර එම කමිටුවේ රේඛීය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකු හෝ ඒ සමාන මට්ටමේ අධ්‍යක්ෂවරයෙකු සාමාජිකයෙකු ලෙස පත්කර නොතිබුණි.

2.3 **වෙනත් කරුණු**

(අ) සමාගමේ සේවකයින්ගේ මාසික මූල් ඉපයීම්වලින් සියයට 10 ක් සේවකයින්ගෙන්ද සියයට 15ක දායකත්වයක් සමාගම විසින්ද දරමින් සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය සපයා තිබුණි .එහිදී අවම දායකත්වය වූ සියයට 12 ඉක්මවා සියයට 3 ක් වැඩිපුර ගෙවීම සඳහා ලබාගත් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවුණි .ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ සියයට 12 ඉක්මවා ගෙවා ඇති සියයට3 ක් වූ අනුමැතිය රහිත සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල රු 4,806,084.ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දිනට 31රු 1,436,998,718.ක් වූ වෙළඳ ණයගැති ශේෂයෙහි වර්ෂ5 ට වැඩි ශේෂය රු 181,345,597.ක් වූ අතර ඒ තුල ඇතුළත් රු 73,002,772. ක් වූ සෞම්‍යමූර්ති තොණ්ඩමන් පදනමින් අයකර ගතයුතු ශේෂය වර්ෂ 5 ඉක්මි වූ මුළු ණයගැති ශේෂයෙන් සියයට 40 ක් පමණ විය .තවද වෙනත් ලැබිය යුතු දෑ තුළ ඇතුළත් රු14.,125, 955ක් වර්ෂ 3 සිට 13 දක්වා කාලයක සිට පැවත එන ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2025මැයි 19 දිනැති අභ්‍යන්තර විගණන වාර්තාවට අනුව තීරුබදු රහිත වෙළඳසැල්වල ගබඩාවල 2025 මාර්තු 22 දිනට පැවති තොගවලින් රු 1,089,556.ක් වූ තොග නරක් වූ තොග ලෙසද රු 13,884,042.ක් වූ තොග විකිණීමට නොහැකි තොග ලෙසද තහවුරු කර තිබුණි .උක්ත තොග සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණ පවත්වා එලෙස තොග හානියට හේතු හා වගකිවයුතු පාර්ශව හඳුනා ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) 2024ජුනි 04 දිනැති අංක අමප 106/604/0989/24/දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රාජ්‍ය ආයතන විසින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී එක් මිල කැඳවීමක් මත) සෘජු මිලදී ගැනීම් (සමාගමෙන් මිලදී ගැනීමට ලබා දී තිබූ අනුමැතිය 2025 ජූලි 30 දින අවසන් වී තිබුණ ද නැවත කාලය දීර්ඝ කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු372.,005, 293ක් වූ වෙනත් ගෙවිය යුතු ශේෂ සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබූ අතර එම ශේෂය තුළ දීර්ඝකාලීනව නොවෙනස්ව පැවැති රු16.,171, 233ක ශේෂයක් ද පැවතුණි .එසේ වුවද එම ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි .

(ඡ) 2023/2022 මූල්‍ය වර්ෂයේදී තලංගම Q shop ප්‍රදර්ශනාගාරය රු 2,245,320.ක වියදමක් දරා ඉදිකර තිබුණ ද කිසිදු ආදායමක් උත්පාදනය කර නොතිබුණි .

(ජ) සමාගම විසින් කුලියට ගෙන තිබූ නාරාහේන්පිට විශේෂ ආර්ථික මධ්‍යස්ථානයේ අංක 07 දරන ගබඩා පරිශ්‍රය වෙනුවෙන් කුලී ගිවිසුමක් අත්සන් කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී සමාගම විසින් රු .මිලියන 63 ක වියදමක් දරා එම ගබඩා පරිශ්‍රය නවීකරණය කර තිබුණි.

(ඣ) අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප් ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව අදාළ කර නොගත යුතු වුවද සමාගම විසින් සේවකයින් 202 දෙනෙක් සඳහා සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද නිවාඩු දින දීමනා ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව අදාල කර ගැනීම හේතුවෙන් රු 3,220,465.ක් වැඩිපුර ගෙවා තිබුණි .

ජී.එච්.ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

7

# විශේෂ වැඩසටහන් 2024/2025



අවුරුදු උදානය



රාජ්‍ය සේවා අභියෝගතා කුසලානය



ලේ දන්දීමේ කඳවුර



නත්තල් කැරොල් ප්‍රසංග




වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන්



වෙසක් දන්සල




විශේෂ පුහුණු වැඩසටහන් සහ සුහද හමුවීම්

# විස්තීරණ ආදායම් ප්‍රකාශනය

2025 මාර්තු 31න් අවසන් වසර සඳහා

| | සටහන් | 2024/2025 රු. | 2023/2024 රු. |
|---|---|---|---|
| ආදායම | 03 | 8,787,080,088 | 12,132,029,706 |
| විකුණුම් පිරිවැය | | (7,889,946,925) | (10,164,817,761) |
| **දළ ලාභය** | | **897,133,163** | **1,967,211,946** |
| අනෙකුත් මෙහෙයුම් ආදායම / (වියදම) | 04 | 48,759,475 | 57,275,265 |
| | | **945,892,638** | **2,024,487,211** |
| බෙදා හැරීමේ වියදම් | 05 | 206,827,950 | 221,093,107 |
| පරිපාලන වියදම් | 06 | 498,777,151 | 507,538,260 |
| | | **705,605,101** | **728,631,367** |
| **පොළී සහ බදුවලට පෙර ඉපැයුම්** | | **240,287,536** | **1,295,855,843** |
| මූල්‍ය ආදායම | 07A | 172,798,513 | 272,189,109 |
| මූල්‍ය ආදායමේ වියදම | 07B | 43,087,172 | 66,830,005 |
| **බදුකරණයට පෙර ලාභය / අලාභය** | | **369,998,877** | **1,501,214,947** |
| බදුකරණය | 08 | (111,102,304) | (535,046,293) |
| **වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(අලාභය)** | | **258,896,573** | **966,168,654** |
| **අනෙකුත් විස්තීරණ ආදායම** | | | |
| සේවක ප්‍රතිලාභ මත ලාභ/(අලාභ) | | (13,404,492) | (2,280,886) |
| අනෙකුත් විස්තීරණ ආදායම මත බදු | | (4,021,347) | (684,266) |
| වත්කම් ප්‍රත්‍යාගණන ලාභය | | - | 3,615,021,486 |
| **අනෙකුත් විස්තීරණ ආදායම (අලාභ) - බදු අයකල පසු** | | **(17,425,839)** | **3,612,056,334** |
| **වර්ෂය සඳහා සමස්ථ විස්තීරණ ආදායම (අලාභ) - බදු අයකළ පසු** | | **241,470,734** | **4,578,224,988** |
| **කොටසක් සඳහා මූලික ඉපැයුම** | 09 | **26** | **97** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීමේ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවලට අනිවාර්ය අංගයක් වේ.
(වරහන් තුල ඇති සංඛ්‍යා අඩු කිරීම් දක්වයි)

# මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

## 2025 මාර්තු 31න් අවසන් වසර සඳහා

| | සටහන් | 2024/2025 රු. | 2023/2024 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 10 | 4,062,345,363 | 4,123,444,204 |
| අස්පෘශ්‍ය වත්කම් | 10A | 5,134,969 | 8,025,000 |
| කොටස් වල ආයෝජන | 11 | 20 | 20 |
| සේවකයන්ට ලබා දුන් ණය | 12A | 16,398,546 | 17,632,082 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **4,083,878,898** | **4,149,101,306** |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 13 | 1,565,287,003 | 1,089,692,167 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 14 | 1,581,965,526 | 1,922,987,431 |
| සේවකයන්ට ලබා දුන් ණය - වත්මන් කල් පිරීම | 12A | 8,100,152 | 7,523,887 |
| ස්ථාවර තැන්පතුවල කෙටිකාලීන ආයෝජන | | 1,179,701,397 | 1,358,308,950 |
| කෙටිකාලීන අයෝජන - ගොඩ නැගූ ලාභාන්තිකය - මහජන බැංකුව | | 18,477,015 | 18,688,366 |
| කෙටිකාලීන අයෝජන - ගොඩ නැගූ ලාභාන්තිකය - ජා.ස. බැංකුව | | 4,911,359 | 3,112,145 |
| මුදල් හා මුදලට සමාන දෑ | 15 | 16,586,413 | 69,166,814 |
| **මුළු ජංගම වත්කම්** | | **4,375,028,867** | **4,469,479,759** |
| **මුළු වත්කම්** | | **8,458,907,766** | **8,618,581,066** |
| **ස්කන්ධය සහ වගකීම** | | | |
| **ප්‍රාග්ධන සහ සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (රු.10 සාමාන්‍ය කොටස් මිලියන 10) | | 100,000,000 | 100,000,000 |
| පොදු සංචිත | | 45,607,646 | 45,607,646 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 3,969,829,684 | 3,969,829,684 |
| අනෙකුත් සංචිත | | (50,601,004) | (33,175,165) |
| රඳවාගත් ඉපැයුම් | | 2,120,910,352 | 2,087,400,340 |
| **මුළු ස්කන්ධ** | | **6,185,746,679** | **6,169,662,506** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 16 | 54,023,776 | 40,446,241 |
| ශුද්ධ විලම්භිත බදු වගකීම | 17 | 18,150,392 | 30,437,267 |
| රජයේ ප්‍රදාන සහ විලම්භිත ආදායම් ගිණුම | 21 | 95,314,139 | 119,751,820 |
| ගෙවිය යුතු කල්පිත වැට් | 22 | 81,962,048 | - |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **249,450,354** | **190,635,329** |
| **ජංගම වගකීම්** | | | |
| කෙටිකාලීන ණයගැනීම් | 18 | 681,590,754 | 791,639,266 |
| වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | 19 | 952,451,804 | 1,115,772,679 |
| බැංකු අයිරා | 20 | 310,490,939 | 350,871,279 |
| ගෙවිය යුතු කල්පිත වැට් | 22 | 79,177,229 | - |
| **මුළු ජංගම වගකීම්** | | **2,023,710,726** | **2,258,283,224** |
| **මුළු ස්කන්ධ සහ වගකීම්** | | **8,458,907,766** | **8,618,581,066** |

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතා සමග අනුකූල වේ.

**චතුර දයාරත්න**
සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය

**චමිල ඉද්දමල්ගොඩ**
සාමාන්‍යාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. සීමාසහිත ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ ඒ වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලදී.

**රවීන්ද්‍ර ප්‍රනාන්දු**
සභාපති

**ආර්. එම්. විජේසිංහ බණ්ඩා**
අධ්‍යක්ෂ

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීමේ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවලට අනිවාර්ය අංගයක් වේ.
(වරහන් තුල ඇති සංඛ්‍යා අඩු කිරීම් දක්වයි)

# ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

2025 මාර්තු 31න් අවසන් වසර සඳහා

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. | ප්‍රත්‍යාගණන සංචිත රු. | පොදු සංචිත රු. | අනෙකුත් සංචිත රු. | රඳවාගත් ලාභය/අලාභය රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| 2023 අප්‍රේල් 1 වැනි දිනට ශේෂය | 100,000,000 | 354,808,198 | 45,607,646 | (30,210,013) | 1,312,041,000 | 1,782,246,831 |
| වසර සඳහා ශුද්ධ ලාභය/(අලාභය) | - | - | - | - | 966,168,654 | 966,168,654 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම මත ආයුගණක ශුද්ධ ලාභය / (අලාභ) සහ බදු ශුද්ධ | - | - | - | (2,965,152) | - | (2,965,152) |
| පෙර වසරේ ගැලපුම් | - | - | - | - | (809,314) | (809,314) |
| වසර තුළ නැවත ඇගයීම | - | 3,615,021,486 | - | - | - | 3,615,021,486 |
| ලාභාංශ ගෙවීම (පෙර වර්ෂය) | - | - | - | - | (87,500,000) | (87,500,000) |
| ලාභාංශ ගෙවීම (වත්මන් වර්ෂය) | - | - | - | - | (102,500,000) | (102,500,000) |
| **2024 අප්‍රේල් 01 දිනට ශේෂය** | **100,000,000** | **3,969,829,684** | **45,607,646** | **(33,175,165)** | **2,087,400,340** | **6,169,662,505** |
| | | | | | | |
| **2024 අප්‍රේල් 01 දිනට ශේෂය** | **100,000,000** | **3,969,829,684** | **45,607,646** | **(33,175,165)** | **2,087,400,340** | **6,169,662,507** |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(අලාභය) | - | - | - | - | 258,896,573 | 258,896,573 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක ශුද්ධ ලාභ/(අලාභ) සහ බදු පසු | - | - | - | (17,425,839) | - | (17,425,839) |
| පෙර වසරේ ගැලපුම් | - | - | - | - | (6,747,285) | (6,747,285) |
| යෝජිත ලාභාංශ සඳහා ප්‍රතිපාදන (පෙර වර්ෂය) | - | - | - | - | (47,500,000) | (47,500,000) |
| ලාභාංශ ගෙවීම (වත්මන් වර්ෂය) | - | - | - | - | (10,000,000) | (10,000,000) |
| කල්පිත වැටි වියදම් - පෙර වර්ෂය | - | - | - | - | (161,139,276) | (161,139,276) |
| **2025 මාර්තු 31 දිනට ශේෂය** | **100,000,000** | **3,969,829,684** | **45,607,646** | **(50,601,004)** | **2,120,910,352** | **6,185,746,679** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීමේ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවලට අනිවාර්ය අංගයක් වේ.
(වරහන් තුල ඇති සංඛ්‍යා අඩු කිරීම් දක්වයි)

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

## 2025 මාර්තු 31න් අවසන් වසර සඳහා

| | 2024/2025<br>රු. | 2023/2024<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | |
| බදු කරණයට පෙර ශුද්ධ ලාභය | 369,998,877 | 1,501,214,947 |
| **ගැලපීම්** | | |
| ක්ෂයවීම/ක්‍රමක්ෂය | 84,877,520 | 71,820,585 |
| පොළී ආදායම | (169,754,831) | (272,189,109) |
| රජයේ ප්‍රදාන විලම්භිත ආදායම | (24,437,682) | (24,437,682)) |
| කෙටිකාලීන ණය සහ අයිරා පොළිය | 43,087,172 | 66,830,005 |
| කල්පිත වැට් සඳහා ප්‍රතිපාදන | (161,139,276) | - |
| යෝජිත ලාභාංශ | (47,500,000) | - |
| දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීමේ ලාභය/(අලාභය) | 1,521,628 | - |
| තොග සහ ණයගැති කපාහැරීම් | - | 503,478 |
| ණයගැති හානිය | 3,250,185 | 68,461,383 |
| තොග හානිය | 2,386,465 | (13,893,794) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් සඳහා ප්‍රතිපාදන | 6,414,775 | 11,918,676 |
| පෙර වසරේ ගැලපුම් | (6,747,285) | (809,314) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය** | **101,957,549** | **1,409,419,176** |
| තොග භාණ්ඩ (වැඩිවීම /අඩුවීම) | (477,981,301) | 391,391,002 |
| වෙළඳ ණයගැතියන්ගේ (වැඩිවීම/අඩුවීම) | 273,811,853 | (996,505,576) |
| රජයේ ප්‍රදාන විලම්බිත ආදායම (වැඩිවීම / අඩුවීම) | - | (24,437,682) |
| ගෙවිය යුතු කල්පිත වැට් බදු (වැඩිවීම / අඩුවීම) | 161,139,276 | - |
| ලබා දී ඇති කාර්ය මණ්ඩල ණය (වැඩි කිරීම / අඩු කිරීම) | 657,269 | - |
| වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ (වැඩිවීම/අඩුවීම) | 163,436,824 | (1,858,084,916) |
| **මෙහෙයුම්වලින් උත්පාදිත මුදල්** | **223,021,469** | **(1,078,217,996)** |
| ගෙවනු ලැබූ රඳවාගැනීමේ බද්ද | (11,854,014) | (18,196,251) |
| ගෙවනු ලැබූ ආදායම් බද්ද | (442,314,209) | (272,724,531) |
| ගෙවනු ලැබූ පාරිතෝෂික | (6,241,733) | (7,997,040) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලදී යොදාගත් ශුද්ධ මුදල්** | **(237,388,486)** | **(1,377,135,818)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ** | | |
| දේපළ, පිරියත හා උපකරණ අත්කරගැනිම | (23,890,277) | (12,326,955) |
| බැහැරකිරීම්වලින් ලත් මුදල් | 1,480,000 | - |
| කෙටිකාලීන ආයෝජනවලින් ලැබුණු පොළිය | 233,714,698 | 363,925,785 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල්** | **211,304,421** | **351,598,830** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහ** | | |
| ස්ථිර තැන්පතු තුළ ශුද්ධ (ආයෝජන)/ උපලබ්ධි වීම් | 178,607,552 | 310,391,050 |
| කෙටි කාලීන අයෝජන - ගොඩ නැගූ ලාභාන්තිකය - මහජන බැංකුව | 211,351 | 6,578,561 |
| කෙටි කාලීන අයෝජන - ගොඩ නැගූ ලාභාන්තිකය -NDB බැංකුව | (1,799,214) | (1,880,745) |
| ශුද්ධ ණය ආපසු ගෙවීම් සහ උත්පාදන | (110,048,512) | 778,039,266 |
| ගෙවන ලද කෙටි කාලීන ණය සහ අයිරා පොළිය | (43,087,172) | (66,830,005) |
| ගෙවා ඇති ලාභාංශ | (10,000,000) | (190,000,000) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ** | **13,884,005** | **836,298,128** |
| මුදල් හා මුදලට සමාන දෑ ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | (12,200,061) | (189,238,860) |
| වසර ආරම්භයේදී මුදල් හා මුදලට සමාන දෑ | (281,704,465) | (92,465,605) |
| **වසර අවසානයේදී මුදල් හා මුදලට සමාන දෑ - (සටහන අ)** | **(293,904,526)** | **(281,704,465)** |

**සටහන අ - මුදල් හා මුදලට සමාන දෑ විශ්ලේෂණය**

| **බැංකුවේ ඇති මුදල්** | 2025.03.31 දිනට<br>රු. | 2024.03.31 දිනට<br>රු. |
|---|---|---|
| ලංකා බැංකුව ( A/C No 8859546) | 270,158 | 270,158 |
| සම්පත් බැංකුව (A/C No 000930000337) | 98,913 | 1,218,404 |
| සම්පත් බැංකුව DFS ( A/C No 002930006974) | 8,140 | 508,313 |
| ලංකා බැංකුව (A/C No 1060) | - | 681,790 |
| මහජන බැංකුව - කුරුණෑගල | 2,065,577 | 1,011,200 |
| මහජන බැංකුව - මාතර | 1,669,667 | 2,425,851 |
| මහජන බැංකුව - නුවර | 2,067,648 | 1,824,267 |
| මහජන බැංකුව - කල්මුණේ | 1,000,000 | 3,110,331 |
| ජාතික සංවර්ධන බැංකුව (A/C- 101000160408) | 102,123 | 235,845 |
| මහජන බැංකුව - සහල් 004 1 001 8 0206579 | 317,929 | 377,929 |
| මහජන බැංකුව - සහල් 004 1 002 7 0206579 | 10,851 | 51,951 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 26,919 | 26,204 |
| | | |
| **අතැති මුදල්** | | |
| සුළු මුදල් අග්‍රිමය | 675,255 | 643,586 |
| අතැති මුදල් | 8,273,235 | 56,780,985 |
| | | |
| **බැංකු අයිරා** | | |
| මහජන බැංකුව (A/C No- 004100120210918) | (115,101,831) | (350,871,279) |
| ලංකා බැංකුව - A/C No.1060 | (195,389,109) | - |
| | **(293,904,526)** | **(281,704,465)** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීමේ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවලට අනිවාර්ය අංගයක් වේ.
(වරහන් තුල ඇති සංඛයා අඩු කිරීම් දක්වයි)

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2024/2025

**1. පොදු විස්තරය**

සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කොට ඇත.

මෙහි ලියාපදිංචි ප්‍රධාන කාර්යාලය අංක 100, නවම් මාවත, කොළඹ 02 යන ස්ථානයේ සිය ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබයි.

ආයතනයේ ප්‍රධාන කර්තව්‍ය මෙහෙයුම් වෙළඳාම හා ප්‍රතිසම්පාදන කටයුතු වන අතර රාජ්‍ය අංශයේ ප්‍රධාන සැපයුම්කරුවෙකු ලෙස ද ආයතනය ක්‍රියා කරනු ලබයි.

2025 මාර්තු 31 වන දිනට ආයතනික ශ්‍රම බලකාය 285 කි. (2023/2024 - 300)

**2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සාරාංශය**

**2.1 පිළියෙළ කිරීමේ පදනම**

**2.1.1 අනුගත වීමේ ප්‍රකාශනය**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාර ආයතනයේ නව ප්‍රමිතීන්ට අනුකූලව සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ නියාමයන්ට අනුකූල වන අයුරින් සකස් කොට ඉදිරිපත් කර ඇත.

**2.1.2 ඉදිරිපත් කිරීමේ පදනම**

පහත දැක්වෙන අයිතමයන් හැර අනෙකුත් සියළුම අයිතම ගෙනහැර දක්වා ඇත්තේ "ඓතිහාසික පිරිවැය" පදනම් පදනම් කර ගනිමිනි.

අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ට අනුව, විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම වර්ථමාන අගයට පෙන්වා ඇත්තේ ප්‍රක්ෂිප්ත ඒකක ණය ක්‍රමය පදනම් කර ගනිමිනි.

ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය සමාගම් කටයුතු අධීක්ෂණයෙන් පසුව ආයතනයේ කටයුතු අනාගත කාල පරිච්ඡේදයක් සඳහා කරගෙන යාමට අවශ්‍ය සම්පත් සමාගම සතු බව තහවුරු කර ඇත. එම නිසා අඛණ්ඩ පැවැත්ම නැමති සංකල්පය මූල්‍ය ප්‍රකාශ ප්‍රකාශයට පත් කිරීමේදී සැලකිල්ලට ගෙන ඇත.

**2.1.3 සංසන්දනාත්මක විශ්ලේෂණය**

පසුගිය වසර වල මූල්‍ය ප්‍රකාශන වල අදාල ශේෂයන් ජංගම වර්ෂයේ ඉදිරිපත් කිරීම් වලින් සනාථ කිරීම සඳහා අවශ්‍ය විටදී නැවත වර්ගීකරණය කොට දක්වා ඇත.

**2.1.4 ඇස්තමේන්තු සහ තීරණාත්මක ගිණුම්කරණ විනිශ්චයන් භාවිතය**

මූල්‍ය ප්‍රකාශන අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුව පිළියෙල කිරීමේදී කළමණාකාරීත්වය විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන භාවිතයට ගෙන ඇති අතර මෙමගින් වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් කෙරෙහි සෘජු බලපෑමක් ඇති අවස්ථාවන්හි දී ප්‍රකාශයට පත් කරන ප්‍රකාශන සැබෑ තත්වයට වෙනස් විය හැකිය.

මෙම ඇස්තමේන්තු සහ උපකල්පන වාර්ෂිකව කළමණාකාරීත්වයේ සමාලෝචනයට පත්වන අතර එම අවස්ථාවන්හි දී ගිණුම්කරණ ඇස්තමේන්තු වලට සිදු කරන ලද ප්‍රතිශෝධන අදාල ගිණුම් වර්ෂයේ හදුනා ගැනීම සහ එම ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කිරීම සහ ඉදිරි ගිණුම් වර්ෂ වල මූල්‍ය ප්‍රකාශන වලට ගනු ලබයි.

සටහන් අංක 16 - ගිණුම් කිරීමේ නිශ්චිත විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම.

මූල්‍ය ප්‍රකාශන සඳහා බලපාන උද්ධමනකාරී සාධක වලට ගැලපීම් සිදු කර නොමැත. වැදගත් සහ සුදුසු ප්‍රතිපත්තීන් ඉදිරි සටහන්වල ඉදිරිපත් කර ඇත.

**2.1.5 විදේශීය මුදල් ගණුදෙනු පරිවර්තනය**

**(අ) ඉදිරිපත් කොට භාවිතයේ ඇති සහ ක්‍රියාකාරී මුදල් ඒකකය**

විදේශ මුදල් ගණුදෙනු ගිණුම්ගත කිරීමේ දී අදාල ගණුදෙනුව සිදු වූ දිනට පැවති විදේශීය හුවමාරු අනුපාතය පදනම් කර ගනු ලබයි. අදාල ගණුදෙනු පියවීමේ දී ඇති වූ ලාභ හෝ අලාභ පරිවර්තනය කර ඇත්තේ වසර අවසානයේ පැවති හුවමාරු අනුපාතයන්ට අනුවයි. ආයතනයේ ගිණුම් පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි. මෙය ශ්‍රී ලංකාව තුල ක්‍රියාකාරීත්වය දරණ මුදල් ඒකකය වේ.

**(ආ) ගණුදෙනු සහ ශේෂයන්**

විදේශ මුදල් ගණුදෙනු ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමේ දී අදාල දිනට පැවති විනිමය අනුපාතය අනුව ගලපා ගිණුම් වල දක්වා ඇත.

**2.2 වත්කම් සහ ඒවායේ වටිනාකම තක්සේරු කිරීමේ පදනම**

**2.2.1 දේපල, පිරියත සහ උපකරණ**

**2.2.2 හඳුනා ගැනීම සහ මිනුම් කිරීම**

ආයතනය විසින් ගොඩනගා ගත් වත්කම්වල අගය පෙන්වා ඇත්තේ ඒ වෙනුවෙන් දරන ලද අමු ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රමය සහ දරන ලද අනෙකුත් සෘජු වියදම් ද ඇතුලත්ව එම වත්කම් භාවිතයට ගතහැකි වන ආකාරයට පත් කර ගැනීමට දැරූ සියලු පිරිවැය ඇතුලත් අගයට වේ.

කිසියම් දේපල, පිරියත හා උපකරණ වර්ෂ කිහිපයක දී මිලට ගත් වත්කම් නම් එහි ඵලදායී ජීව කාලය බෙදා දැක්වීම කළ යුත්තේ ප්‍රධාන සංඝටක වල පැවැත්ම පදනම් කර ගනිමිනි.

දේපල, පිරියත හා උපකරණවල සමුච්චිත ක්ෂය අගය අඩු කළ පසු අගය වාර්ෂික සමාලෝචනයට ලක්වන අතර කිසියම් වෙනස්කමක්

සිදු වුව හොත් එම වෙනස්කමට අදාල පිරිවැය මත වූ ක්ෂය අගය අඩු කිරීමෙන් අනතුරුව එය ගෙන හැර දැක්වේ. එම ක්ෂය කල අගය අඩු කර නොහැකි අවස්ථාවල දී ඒ එම වත්කම මත වූ ක්ෂය ලියා හැර ඉන්පසු ඉතිරි වන අගය එම දේපල, එසේ නැත්නම් පිරියත, උපකරණ පොත් අගය ලෙස ගෙන හැර දක්වනු ලැබේ.

2024 වසරේදී සිදු කරන ලද ප්‍රත්‍යාග ණනය මත පදනම්ව ඉඩම් හා ගොඩනැගිලි ගිණුම් ගතකර ඇත. එහි අගයෙහි කිසියම් වැඩිවීමක් සිදු වී නම් අනෙකුත් අදායම් ප්‍රකාශයේ අනෙකුත් විස්තීර්ණ ආදායම් යටතේ සහ හිමිකම් වෙනස් වීමේ ප්‍රත්‍යාග ණන සංචිතයේ දක්වනු ලැබේ. එකම වත්කමේ පෙර වැඩිවීම් වලට හිලව් කර ඇති අගය අඩුවීම් හිමිකම් ප්‍රකාශයේ ප්‍රත්‍යාගණන සංචිතයට එරෙහිව අය කෙරේ. නැවත තක්සේරු කිරීමේ දිනයෙන් පසුව, ගොඩනැගිලි සඳහා අය කරනු ලබන සමුච්චිත ක්ෂයවීම් සහ හානි අවම කිරීමේ අඩු කර, ඉඩම් සහ ගොඩනැගිලි සාධාරණ වටිනාකමකින් ගණනය කරනු ලැබේ.

පිරියත සහ උපකරණ, සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි අලාභ අඩු කර පිරිවැයට දක්වා ඇත. නැවත ඇගයීම 2024 දී සිදු කර ඇති අතර ඒ අනුව අගයන් ප්‍රකාශ කර ඇත.

### 2.2.3 පසුව සිදු වූ පිරිවැය

දේපල, පිරියත හා උපකරණයන් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද පිරිවැය හේතුවෙන් එහි ඵලදායි ජීව කාලය වැඩි වන්නේ නම්, එහි අගය ගණනය කළ හැකි නම් එවැන්නක් ගිණුම් ගතකරනු ලබන අතර එය ප්‍රාග්ධන වියදමක් ලෙස ගෙනහැර දැක්වේ. දේපල, පිරියත හා උපකරණ දෛනික භාවිතයේ දී සිදුවන වියදම් ගෙන දක්වනු ලබන්නේ ආයතනයේ ආදායම් ප්‍රකාශයෙහි වේ.

### 2.2.4 නොහඳුනා ගැනීම

දේපල, පිරියත හා උපකරණයන්හි ධාරණ පිරිවැය හඳුනා ගන්නා අතර එම වත්කම සඳහා ආර්ථික වටිනාකමක් නොමැති අවස්ථාවන්හි දී හෝ භාවිතයෙන් ඉවත් කර ඇති විට දී එය ආයතනය විසින් බැහැර කෙරේ. එහි දී ඇතිවන ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයෙහි දැක්වේ.

### 2.2.5 ක්ෂය

ආයතනයේ දේපල, පිරියත හා උපකරණ ක්ෂය කිරීමේ දී එය ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලබන්නේ, “සරල මාර්ග ක්‍රමය” යටතේ පිරිවැය හෝ ප්‍රත්‍යක්ෂිත වටිනාකමෙන් සුන්බුන් අගය අඩු කර ඵලදායි ජීවිත කාලය පුරාවට බෙදා හැරීමෙනි. ලීසිං පහසුකම් යටතේ ඇති වත්කම් ක්ෂය කරනු ලබන්නේ ලීසිං පහසුකම් සලසනු ලබන හෝ එම වත්කමේ ජීව කාලය යන අයිතම දෙකෙන් අඩු කාල සීමාවටයි. ඉඩම් ක්ෂය කරනු නොලැබේ.

වත්මන් සහ සංසන්දනාත්මක කාල සීමාවන් සඳහා ඇස්තමේන්තුගත ඵලදායි ජීව කාලය සහ ක්ෂය අනුපාත පහත දැක්වෙන පරිදි වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | 7.5% |
| රථවාහන | 20% |
| කාර්යාල උපකරණ | 10% |
| ගෘහ භාණ්ඩ/සවිකිරීම් | 10% |
| පරිගණක මෙවලම් | 33.33% |
| ප්‍රදර්ශනාගාර උපකරණ | 20% |

**බදුකර වත්කම් මත වියදම් දැරීම**

කල්බදු කාල සීමාව හෝ ගොඩනැගිලි ක්ෂය කළ හැකි කාල සීමාව යන දෙකින් වඩා අඩු කාල සීමාව

සෑම වසරකම ක්ෂය කරනු ලබන ක්‍රමය සහ අයිතමයන්ගේ ජීව කාලය සමාලෝචනය කර කළමනාකාරීත්වය විසින් මූල්‍ය වාර්තාවල ගෙනහැර දක්වනු ලබයි.

### 2.2.6 අස්පෘශ්‍ය වත්කම් (ශ්‍රීලගිප්‍ර 38)

2022/2023 වසර අවසානයේදී පරිගණක මෘදුකාංග පද්ධතිය ප්‍රත්‍යාගණනය කරනු ලැබිය. මෘදුකාංග පද්ධතියේ ප්‍රයෝජනවත් අනාගත ආයු කාලය වසර 3ක් ලෙස ඇස්තමේන්තු ගත කර ඇත. ප්‍රයෝජනවත් ආයු කාලය මත පදනම්ව, ක්ෂයවීම් අනුපාතය පහත පරිදි නිර්ණය කර ඇත.

පරිගණක මෘදුකාංග පද්ධතිය 33.3%.

### 2.2.7 මූල්‍යමය ව්‍යුත්පන්න වත්කම් වර්ගීකරණය

ආයතනය මූල්‍යමය වත්කම් මෙසේ ගෙනහැර දක්වනු ලබයි. සාධාරණ අගය මත ලැබිය යුතු දෑ ලෙස සහ විකිණීම සඳහා කල් පිරුණු පසුව යන අයුරින් මෙම ඉදිරිපත් කිරීම සිදුවේ.

කළමනාකාරීත්වය එම වත්කම් ප්‍රථමයෙන් ඉහත ලෙස වර්ගීකරණය කරනු ලබන අතර ආයතනය තුළ මෙම වර්ෂය තුල දී කිසිදු මූල්‍යමය වත්කමක් නොවීය.

### 2.2.8 ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ මූල්‍යමය වත්කම් ලෙස දැක්වෙන අතර මෙම අයිතමවල වටිනාකම නිශ්චය කිරීමට වෙළඳපොළ වටිනාකම් ගත නොහැක්කේ එය ක්‍රියාකාරී වෙළඳපොළ තුළ සංසරණය නොවන බැවිනි. මෙම වත්කම් ජංගම වත්කම් වන අතර මාස 12 ට වැඩි කාලයකින් පසු කල් පිරෙන්නේ නම් ජංගම නොවන වත්කම් ගණයට අයත් වේ. ආයතනයේ ණය සහ ලැබීය යුතු දෑ “වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ” ගෙන්ද සමන්විතයි. තවද මුදල් හා මුදල් වලට සමාන දෑ ද මෙහි පිළිඹිබු වේ.

### 2.2.9 මූල්‍ය මෙවලම් හිලව් කිරීම

මූල්‍යමය වත්කම් හා මූල්‍යමය වගකීම් හිලව් කොට මූල්‍ය ප්‍රකාශන වල හඳුනා ගනු ලබන්නේ එහි ශුද්ධ වටිනාකම අනුව වන අතර මෙසේ සිදු කිරීමේ අරමුණ වන්නේ මූල්‍යමය වත්කම් හා මූල්‍යමය වගකීම් අගයන් එකවිට හිලව් කිරීමයි.

### 2.2.10 මූල්‍ය වත්කම් හානිකරණය

ක්‍රමක්ෂය පිරිවැය මත වත්කම් ගිණුම්කරණ වර්ෂ අවසානයේ දී ආයතනයේ මූල්‍ය වත්කම්හි අගයේ හානිකරණයක් වීද යන වග සමාලෝචනය කරනු ලබයි. මෙහි දී හානිකරණය වීමට යම්කිසි හේතුදාමයක් සිදුවිය යුතු අතර අවක්ෂේපිත සාධකද මේ සඳහා තිබිය හැකියි. මෙමගින් ආයතනයේ මූල්‍ය වත්කම්වලට හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයේ මුදල් ප්‍රවාහයන්හට බලපෑමක් සිදුවිය හැකි වේ.

මෙයට හේතු ලෙස ණය ගැතියන්ට නැවත ගෙවීමේ නොහැකියාව, වස්තු භංගත්වය හෝ මූල්‍ය ප්‍රතිසංවිධාන කටයුතු දැක්විය හැකියි. තවද, ආර්ථික වාතාවරණය, මූල්‍ය ප්‍රවාහයන් අඩු වීම කෙරෙහි බලපෑ හැකි මූලික සාධකයක් වේ. ණය හා අනෙකුත් ලැබිය යුතු දෑ හි අලාභයන් මිනුනු ලබන්නේ වත්කමේ දැන් පවත්නා අගය සහ අනාගත මුදල් ප්‍රවාහවල අගය වට්ටම් කිරීමෙන් ලැබෙන අගය ගැනීමෙනි. වත්කම් අගය අඩු වන්නේ නම් එය ආදායම් ප්‍රකාශයේ ගෙනහැර දැක්වේ.

### 2.2.11 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

කාල නිර්ණයන් නොමැති වත්කම් ක්‍රමක්ෂය සිදු කරනු නොලබයි. නමුත් වාර්ෂිකව අපහායනය සඳහා පරීක්ෂා කෙරේ. ඉහත සඳහන් වත්කම් හැර අනෙකුත් වත්කම් වාර්ෂිකව අපහායනය සඳහා පරීක්ෂා කරනු ලබයි. එහි දී වටිනාකමේ ඇතිවන වෙනස් වීම් මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලබයි.

### 2.2.12 තොග

I තොග අගය කරන්නේ පිරිවැය හෝ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයටයි. ශුද්ධ උපලබ්ධි අගය ගණනය කරන්නේ සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයන් යටතේ තොගය විකිණිය හැකි අගයෙන් පිරිවැය හා විකුණුම් වියදම් අඩු කිරීමෙන් පසුවය. මූල්‍ය වර්ෂය සඳහා තොග සත්‍යාපනය වර්ෂ අවසානයේ සිදු කර ඇති අතර හානි වූ තොගයන් හඳුනා ගෙන ඇත. ශුද්ධ ලැබිය හැකි වටිනාකම ගිණුම්ගත කර ඇත.

වසරකට පෙර මිලදී ගනු ලැබූ තොග මුළු පිරිවැයෙන් 5% ක හානිකරණ ප්‍රතිපාදනයක් ලබා දීමෙන් පසුව ගිණුම් වලට ගෙන ඇත. වෙළඳපොළ මිල මට්ටම් පිරිවැය මිලට වඩා වැඩි බැවින් වසරක් තුළ මිලදී ගනු ලැබූ තොග පිරිවැයට ගණනය කර ඇත.

II තොගයේ වටිනාකමෙන් විකුණුම් පිරිවැය ලෙස රු. 7,889,946,925 මෙම වර්ෂයේ ආදායම ප්‍රකාශයට ගෙන දක්වා ඇත.

III වෙළඳ තොගය සඳහා 5% ක අපහායන අලාභ ලෙස ප්‍රතිපාදන වෙන් කර ඇති අතර වෙළඳ තොග යේ මුල් වටිනාකම ලබා ගැනීමට ආයතනයට නොහැකි බවට සාධනීය සාක්ෂින් ඇති විට වසරකට වඩා වැඩි තොගයන් සහ හානියට පත් තොගය සඳහා 5% අපහායන වෙන් කිරීමක් ප්‍රතිපාදනය කර ඇත.

iv ඇපකරයන් ලෙස ඇපයට තැබූ වත්කම්

1. ප්‍රතිපත්ති ප්‍රකාශනය

ණය පහසුකම් සඳහා ඇපයක් ලෙස ඇපයට තබා ඇති වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කෙරේ. ආයතනයේ මූල්‍ය බැඳීම් සහ අවදානම් පිළිබඳ පැහැදිලි බවක් ලබා දීම සඳහා ඇපයට තැබූ වත්කම් වර්ග, ධාරණ මුදල් ප්‍රමාණයන් සහ අනුරූප ණය පහසුකම් නිශ්චිතව දක්වා ඇත.

2. හෙළිදරව් කිරීම

ණය පහසුකම් ලබා ගැනීම සඳහා පහත වත්කම් මූල්‍ය ආයතනවලට ඇපයට තබා ඇත.

**අ) තොග භාණ්ඩ**

| මූල්‍ය ආයතනයේ නම | උකස් වටිනාකම (රු.) |
|---|---|
| සම්පත් බැංකුව | 114,000,000.00 |
| ජාතික සංවර්ධන බැංකුව | 130,000,000.00 |

**ආ) ස්ථාවර තැන්පතු හා ගොඩනැගූ ආන්තිකය**

I) ස්ථාවර තැන්පතු

| මූල්‍ය ආයතනයේ නම | උකස් වටිනාකම (රු.) |
|---|---|
| මහජන බැංකුව | 1,019,100,000.00 |

II) ගොඩ නැගූ ආන්තිකය

| මූල්‍ය ආයතනයේ නම | උකස් වටිනාකම (රු.) |
|---|---|
| මහජන බැංකුව | 18, 477,015.00 |
| ජාතික සංවර්ධන බැංකුව | 4, 911,359.00 |

**ඇ) ඉඩම් :** නො. 274 ,
ශ්‍රී ජයවර්ධනපුර
මාවත, රාජගිරිය.

| මූල්‍ය ආයතනයේ නම | උකස් වටිනාකම (රු.) |
|---|---|
| BOC බැංකුව | 700,000,000 |

**ඈ) ණයගැතියා**

| මූල්‍ය ආයතනයේ නම | උකස් වටිනාකම (රු.) |
|---|---|
| සම්පත් බැංකුව | 311,000,000 |
| ජාතික සංවර්ධන බැංකුව | 190,088,641 |

3. මූල්‍ය තත්ත්වය කෙරෙහි බලපෑම

මෙම වත්කම් ඇපයට තැබීම මූල්‍ය ප්‍රකාශන වල ඒවා පිළිගැනීමට බලපාන්නේ නැත, නමුත් අදාළ වගකීම් පියවන තෙක් ඇපයට තැබූ වත්කම් බැහැර කිරීමට සමාගමට ඇති හැකියාව එය සීමා කරයි. වාර්තා කරන දිනට මෙම ඇපයට තැබූ වත්කම් වල ධාරණ අගය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| තොග භාණ්ඩ | : රු. | 244,000,000,00 |
| ස්ථාවර තැන්පතු | : රු. | 1,019,100,000.00 |
| ගොඩ නැගූ ආන්තිකය | : රු. | 23,388,374.00 |
| ඉඩම් | : රු. | 700,000,000.00 |
| ණයගැතියා | : රු. | 501,088,641.00 |

### 2.2.13 වෙළඳ ලැබිය යුතු දෑ

සමාගමට මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබා ගැනීමට ගිවිසුම්ගත අයිතියක් ඇති විට සහ පමණක්, සමාගම එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳ ලැබිය යුතු දේ මූල්‍ය වත්කම් ලෙස හඳුනා ගනී.

ණය එකතු කිරීම වසරක් හෝ ඊට අඩු කාලයක් තුළ (හෝ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ) අපේක්ෂා කරන්නේ නම්, ඒවා ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. එසේ නොමැති නම්, ඒවා ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කෙරේ. වෙළඳ ලැබිය යුතු දේ අපේක්ෂිත උපලබ්ධිත වටිනාකමකට සිදු කරනු ලබන අතර, වසර අවසානයේ සියලුම හිඟ මුදල් ප්‍රමාණයන් සමාලෝචනය කිරීම මත පදනම්ව අඩමාන ලැබිය යුතු දේ සඳහා ඇස්තමේන්තු සකස් කරනු ලැබේ. බොල් ණය හඳුනාගත් වර්ෂය තුළ කපා හරිනු ලැබේ.

පහත සඳහන් නිර්ණායක මත පදනම්ව වෙළඳ ලැබිය යුතු දෑ හානි වීම සඳහා ප්‍රතිපාදන ස්ථාපිතකර ඇත.

* වසරකට වැඩි කාලයක් හිඟ ශේෂයන් ඇති ණය ගැතියන්ට 5% ක සාමූහික හානි වීමක් අදාළ වේ.
* වසර 5 කට වැඩි කාලයක් හිඟ ශේෂයන් ඇති ණය ගැතියන්ට 100% ක සම්පූර්ණ හානි වීමක් අදාළ වේ.

හිඟ මුදල් පසුව අයකර ගන්නා අවස්ථාවන්හිදී, අදාළ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වලට අනුරූප ගැලපීම් සිදු කරනු ලැබේ.

### 2.14 ආයෝජන

#### (අ) දීර්ඝ කාලීන ආයෝජන

දිගුකාලීන ආයෝජන ජංගම නොවන ආයෝජන ලෙස වර්ග කර ඇති අතර ඒවායේ අගය පිරිවැය වෙයි. ආයෝජන අත්පත් කර ගැනීමේ පිරිවැය (මිලදී ගැණුම් පිරිවැය, තැරැව් ගාස්තු, හුවමාරු ගාස්තු) ද ඇතුලත්ව මුළු පිරිවැය ගණනය කරනු ලැබේ.

#### (ආ) කෙටිකාලීන ආයෝජන

කෙටි කාලීන ආයෝජන ශේෂ පත්‍ර දිනට පැවති වෙළඳ අගයට හඳුනා ගනු ලබයි. කෙටිකාලීන ආයෝජනයන් හි ලාභ අලාභ ආදායම් ප්‍රකාශයට ගනු ලැබේ.

### 2.2.15 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ වලින් ගම්‍ය වන්නේ අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු, ඉහල ද්‍රවශීලතාවයකින් යුතු ආයෝජන වේ. මෙහි දී මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ දී යොදා ගනු ලබන්නේ බැංකු අයිරාව හැර අතැති මුදල් හා ඉල්ලූම් තැන්පතු පමණි.

### 2.2.16 ප්‍රකාශිත ප්‍රාග්ධනය

ආයතනයේ සියළුම කොටස් වල එකතුව එහි නාමික අගයෙන් වැඩි කිරීමෙන් ප්‍රකාශිත ප්‍රාග්ධනය ගණනය කොට ඇත.

මෙම ආයතනය සම්පූර්ණයෙන්ම රජය සතු වන අතර එය වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතී.

### 2.2.17 වෙළඳ ගෙවිය යුතු දෑ

සමාගම වෙළඳ ගෙවිය යුතු දෑ මූල්‍ය වගකීමක් සේ සලකනු ලබන අතර එය ශේෂ පත්‍රයේ ගෙවිය යුතු දෑ යටතේ සටහන් කරයි. මෙය සැපයුම්කරුවන් හා ඇති වූ ගණුදෙනු වල ප්‍රතිඵලයක් ලෙස ඇති වන්නා වූ මූල්‍ය වගකීමයි. සැපයුම්කරුවන්ගෙන් ලබාගත් භාණ්ඩ හා සේවා වෙනුවෙන් මුදල් හෝ තවත් එවැනි වත්කම් වලින් ආයතනය ගෙවිය යුතුය. වර්ෂයකට අඩු කාලයක දී ගෙවිය යුතු නම් ඒවා ජංගම වගකීම් වන අතර වර්ෂයකට වඩා වැඩි කාලයක් ගත වේ නම් ඒවා ජංගම නොවන වගකීම් ගණයට අයත් වේ. වෙළඳ ණය හිමියෝ සාධාරණ අගය මත හඳුනා ගෙන ඇත.

### 2.2.18. ණය

ආයතනය ගනු ලබන ණය ප්‍රතිපාදන ප්‍රථමයෙන් සාධාරණ අගය මත හඳුනා ගනු ලබයි. පසුව මෙය ක්‍රමක්ෂය පිරිවැය මත හඳුනා ගැනේ. තවද, වාර්ෂිකව සිදුකරනු ලබන ගෙවීම්, ආදායම් ප්‍රකාශයේ සටහන් වන අතර එහි වගකීම වසරකට වැඩි නම් ජංගම නොවන වගකීම් ලෙසත් වසරකට අඩු නම් ජංගම වගකීමක් ලෙසත් ශේෂ පත්‍රයේ දැක්වේ.

### 2.2.19 රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය

ක්‍රියාකාරකම් සඳහා වූ රජයේ ප්‍රදානයන් පිළිබඳ ගිණුම් කටයුතු LKAS 20 - අනුව සිදු කරනු ලැබ ඇති අතර රජයේ ප්‍රදාන හඳුනා ගනු ලබන්නේ ඒවාට අදාළ කොන්දේසි අදාළ ආයතනය විසින් අනුගමනය කෙරෙනු ඇති බවට හා ප්‍රදානයන් ලැබෙනු ඇති බවට සාධාරණ තහවුරුවක් ඇති විට ය.

ආදායමට සම්බන්ධ ප්‍රදානයන් ඒවායින් හිලවු කිරීමට අදහස් කෙරෙන පිරිවැය සමග ගැලපීම සඳහා අවශ්‍ය කාලපරිච්ඡේදය මුළුල්ලේ ලාභ සහ අලාභ තුළ හඳුනා ගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම හෝ ඉදිකිරීම ආශ්‍රිත රජයේ ප්‍රදානයන් මූලික හඳුනා ගැනීමේදී ආශ්‍රිත වත්කමෙහි පිරිවැයෙන් ප්‍රදාන මුදල අඩු කරනු ලබන හිලවු කිරීමේ ක්‍රමය හෙවත් නෙට්ං ඕෆ් ක්‍රමය භාවිතා කරමින් ගිණුම්ගත කෙරේ. ප්‍රදානයෙහි ඵලය අවකරණ ක්ෂය වියදම හරහා වත්කමෙහි ප්‍රයෝජනවත් ආයුකාලය මුළුල්ලේ ලාභ හෝ අලාභ අනුව හඳුනා ගැනේ

### 2.2.20 ආදායම් බදු

#### අ) වර්තමාන බදු

වර්තමාන ආදායම් බදු ගණනය කර වෙන් කොට ඇත්තේ ව්‍යාපාරයේ මෙහෙයුම් අනුව 2017 අංක 24 දරණ ආදායම් බදු පනතේ නියමයන්ට අනුකූලවය.

#### (ආ) විලම්භිත බදු

විලම්භිත බදු තීරණය කරනු ලැබුවේ මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා සැලකිල්ලට ගනු ලබන වත්කම් හා බැරකම් වල ප්‍රමාණය, බදු වාර්තාකරණය සඳහා සැලකිල්ලට ගනු ලබන ප්‍රමාණය අතර තාවකාලිකව වෙනස මත ගණනය කිරීමෙනි. විලම්භිත බදු ගණනයේදී බදු ගාස්තු හා එයට අදාල නීති භාවිතයට ගෙන ඇත.

විලම්බිත බදු වත්කම් මත හඳුනා ගනු ලබන අතර එය ඉදිරි ගිණුම් වර්ෂ වල දී

ඇති විය හැකි ආයතනයේ ලාභය සමග ගිලවි කොට දැක්වීම සඳහා භාවිත කරනු ලැබේ.

විලම්භිත බදු, බදු වත්කම් සහ වගකීම හිලව් කිරීමේ දී නීත්‍යානුකූල බලාත්මක වන අයුරින් බදු වත්කම් බදු වගකීම් සමග හිලව් කෙරේ.

පමා කරන ලද බදු වත්කම සෑදී ඇත්තේ ආයතනයේ ඉදිරියට ගෙනෙන ලද බදු අලාභය හේතුවෙනි. මෙය ආයතනයේ ගිණුම් ප්‍රකාශ වලට ගෙන නැත්තේ එය අය කරවා ගැනීමට සාමාන්‍ය බදු කාලසීමාවට වඩා කාලයක් ගතවන බැවිනි. මෙය සටහන් වල දක්වා ඇත.

**(ඈ) පිරිවැටුම මත පදනම් වූ බදු**

පිරිවැටුම පාදක බදු වලට එකතු කළ අගය මතබද්ද (VAT) සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) ඇතුළත් වේ.

### 2.2.21 සේවක ප්‍රතිලාභ මත වූ පිරිවැය

**(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම**

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම ලෙස හඳුන්වනු ලබන්නේ වෘත්තීය සේවා කාලය නිම වීමෙන් පසු ක්‍රියාත්මක වන නිශ්චිත දායකත්ව සැලසුම හැර අනෙකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලැස්මකි. ශේෂ පත්‍රයේ ආයතනික වගකීම නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම මගින් ගණනය කොට ඇත්තේ 1983 අංක 12 දරණ පාරිතෝෂිත දීමනා ගෙවීම පිළිබඳ පනතට අනුව වේ.

සේවකයෙකු වෙත විශ්‍රාම දීමනා ගෙවීමේ වගකීම පැන නගිනුයේ වසර 5 ක පූර්ණ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුවය. මෙම වගකීම ගිණුම් ප්‍රකාශන වල හඳුනා ගෙන ඇත. නිශ්චිත ප්‍රතිලාභ සැලසුමේ හිගය හෝ අතිරික්තය වර්ෂය සඳහා ගණනය කරනුයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 ට ප්‍රකාරව වන අතර යොදා ගත් උපකල්පන සටහන් අංක 17හි හෙළිදරව් කොට ඇත.

**(ආ) සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල**

සියලුම සේවක, සේවිකාවන් අර්ථසාධක අරමුදල යටතේ සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල යටතේ ලියාපදිංචි කොට ඇති අතර අදාළ වර්ෂයේ දී එම සේවක සේවිකාවන් සඳහා ගෙවිය යුතු දායක මුදල රෙගුලාසිවලට අනුව සම්පාදනය කොට ඇත.

සියලුම සේවකයින් සඳහා වූ අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට සම්බන්ධ දායකත්වය වියදම් සිදු වූ ආකාරයට ලාභ අලාභ සැකසීමේ දී හඳුනා ගත හැක.

### 2.2.22 ආදායම් හඳුනා ගැනීම

**(අ) භාණ්ඩ විකුණුම් ආදායම**

භාණ්ඩයක් විකුණුම් ලෙස හඳුනා ගනු ලබන්නේ පාරිභෝගිකයා වෙත භාණ්ඩයේ අවධානම සහ අයිතිය හුවමාරු වන අවස්ථාවේ දීය.

**(ආ) සේවා සැපයුම් ආදායම**

සේවා විකුණුම් වලින් ලත් ආදායම හඳුනා ගනු ලබන්නේ සේවාවේ ප්‍රතිලාභ හුවමාරු වූ අවස්ථාවේ දී වන අතර එම ආදායම අදාල ගිණුම් වර්ෂයේ දී හඳුනා ගැනේ.

**(ඇ) පොළී ආදායම**

පොළී ආදායම හඳුනා ගනු ලබන්නේ උපචිතපදනම මත වේ.

**(ඈ) වෙනත් ආදායම්**

වෙනත් ආදායම් ද උපචිත පදනම මත හඳුනා ගනු ලබයි.

**(ඉ) දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීමේ ලාභ**

දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීමේ ලාභ/අලාභ හඳුනා ගනු ලබන්නේ එය බැහැර කළ වර්ෂය තුලයි.

### 2.2.23 වියදම් හඳුනා ගැනීම

**(අ) අයභාර වියදම්**

සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ දී වියදම් හඳුනා ගනු ලබන්නේ ආදායම් ඉපැයීම සඳහා දැරූ පිරිවැය සහ එය මත සෘජු සම්බන්ධතාවය පදනම් කර ගැනීමෙනි.

එදිනෙදා ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම සඳහා දරනු ලබන පිරිවැය, ප්‍රාග්ධන නඩත්තු වියදම් ආදිය මෙහෙය වීමේ වියදම්, ආයතනික වියදම් ආදී කටයුතු වල ඵලදායිතාවය ඉහල නංවමින් ආදායම් ඉපැයීම සඳහා සිදු කළ වියදම් අයභාර වියදම් ලෙස දැක්වේ. වර්ෂ අවසානයේ මෙහි ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයට ගනු ලබයි.

**(ආ) ප්‍රාග්ධන වියදම්**

ප්‍රාග්ධන වියදම් දරනු ලබන්නේ වත්කමේ ස්වභාවය වැඩිදියුණු කිරීමටයි. එනම් ඵලදායිතාවය වැඩි කිරීම සඳහා දරන වියදම් වේ. එසේම ව්‍යාපාරය ඉදිරියට පවත්වා ගෙන යාමට හෝ එහි පරිමාණය වර්ධනය කිරීමට සහ ව්‍යාපාරයේ පැවැත්ම සඳහා ප්‍රාග්ධන වියදම් දරනු ලැබේ.

**(ඇ)ණය ගැනුම්**

ආයතනය ප්‍රධාන ලෙස ණය මුදල් යොදා ඇත්තේ ආයතනයේ ප්‍රාග්ධන වත්කම් වැඩි කර ගැනීමට, ප්‍රතිග්‍රහනය සඳහා සහ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමටය. මෙහි දී ප්‍රාග්ධන වත්කම් වෙනුවෙන් යොදා ඇති වටිනාකම / තක්සේරු අගය අදාල වත්කම් කාණ්ඩය යටතේ දක්වා ඇති අතර අනෙකුත් සියළුම ණය ගැණුම් ආදායම් ප්‍රකාශයේ ගලපා දක්වා ඇත. ණය ගැණුම් යටතේ පොළී සහ ණය සම්බන්ධ අනෙකුත් වියදම් ද දක්වා ඇත.

**(ඈ) ශුද්ධ මූල්‍යමය ආදායම්/ වියදම්**

මූල්‍යමය ආදායම් ලෙස බැංකු තැන්පතු ආයෝජන සඳහා පොළිය, සේවක ණය නැවත ගෙවීම් සහ මූල්‍යමය වත්කම් වල සාධාරණ අගය වෙනස්වීම් ආදායම් ප්‍රකාශයන්හි සටහන් කරනු ලැබේ. පොළී ආදායම් සංචිත පදනම් මත සාධනීය පොළී ක්‍රමය මත හඳුනා ගෙන ඇත.

මූල්‍යමය වියදම් ලෙස පොළී වියදම්/ ගෙවීම, මූල්‍යමය වත්කම් සාධාරණ අගය වෙනස් වීම්, (අපහයන අලාභ) සහ ආයතනයේ ප්‍රාග්ධන වත්කම් කෙරෙහි ඉදිකිරීම් ප්‍රතිග්‍රහනයට අයත් නොවන වත්කම් ආදායම් ප්‍රකාශයෙහි සාධනීය පොළී ක්‍රමය යටතේ හඳුනා ගෙන ඇත.

**(ඉ) බොල් ණය සඳහා වෙන් කිරීම්**

මෙම වෙන් කිරීම හඳුනා ගනු ලබන්නේ වර්තමාන නීතිමය වගකීමක් හෝ අතීතයේ ඇති වූ සමහර ගනුදෙනු පදනම් කර

ගනිමිනි. මෙම ගණුදෙනු නිරවුල් කිරීමේ දී මුදල් ප්‍රවාහ ආයතනයෙන් පිටතට ගලායන අතර මේ සඳහා යොදා ගන්නා වූ උපක්‍රමයක් ලෙස ඇස්තමේන්තුවක් ඇති කිරීම සාමාන්‍යයෙන් සිදු කරයි. තනි තනි ශේෂ සියුම් ලෙස පරීක්ෂා කර බොල් ණය වියදම් හඳුනාගත යුතුය. එසේ හඳුනා ගන්නා පිරිවැය ආවරණය කර ගැනීම උදෙසා ආයතනය විසින් ප්‍රමාණාත්මක ඇස්තමේන්තුවක් ඇති කර ගත යුතුයි.

## 2.24 සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

ආයතනයේ හෝ වෙනත් පරිබාහිර තුන්වන පාර්ශවයක් විසින් කරන්නා වූ ක්‍රියාකාරකම් හේතු කොට ගෙන ආයතනයේ මූල්‍ය ප්‍රතිපත්ති හා තීරණ වලට සැලකිය යුතු අන්දමේ බලපෑමක් කල හැකි නම් හා එසේ සිදු වී ඇති නම් ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වලින් අනාවරණය කළ යුතුය. අදාල තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 22 මගින් හෙළිදරව් කරනු ලබයි.

**ආස්ථිත්වයේ සම්බන්ධිත පාර්ශව**

සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ ක්‍රියාකාරී සම්බන්ධිත ඒකකයන් කිසිවක් නොමැත.

## 2.2.25 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මෙම ආයතනයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය "වක්‍ර ක්‍රමය" අනුව සකස් කර ඇත.

## 2.2.26 අංශ තොරතුරු

ආයතනය නියැලී සිටින ව්‍යාපාරික ක්‍රියාකාරකම් සහ එහි ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුළින් උපයන ආදායම්, දරන ලද වියදම මෙහෙයුම් අංශ තුළ ඇතුලත් වේ. ආයතනයේ අනෙකුත් අංශ වලින් සිදුවන ගණුදෙනු සමග මෙහෙයුම් අංශ ආදායම සහ වියදම හඳුනා ගනු ලබයි. අංශවල සම්පත් බෙදා හැරීම සම්බන්ධයෙන් තීරණ ගැනීම සහ කාර්යසාධන තක්සේරු කිරීම සඳහා සියළුම මෙහෙයුම් අංශවල මෙහෙයුම් ප්‍රතිඵල ක්‍රමවත් ලෙස ආයතනයේ කළමණාකාරීත්වය විසින් සමාලෝචනයට ලක් කරනු ලබයි.

මේ සඳහා වෙන් වෙන්ව පවතින මූල්‍ය තොරතුරු ලබාගත හැකිය. මේ තොරතුරු මූල්‍ය ප්‍රකාශන තුළ සටහනක් මගින් හෙළිදරව් කර ඇත.

## 2.2.27 කොටසක ඉපැයුම

